# වාර්ෂික වාර්තාව

# 2023/2024


**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

**දළුපිටිය පාර, හුණුපිටිය, වත්තල**

*දුරකථන: 011-2948102/03, 011-2941859*

*ෆැක්ස්: 011-2930252, 011-2949126*

*ඊමේල්: ccffinance@yahoo.com*

*වෙබ් : www.ccfl.gov.lk*

| පටුන | | පිටු අංකය |
|---|---|---|
| **1.** | ආයතනයේ තොරතුරු | |
| 1.1 | දැක්ම සහ මෙහෙවර | 03 |
| 1.2 | අප සමාගමෙහි සාරධර්මයන් | 04 |
| 1.3 | අප ගමන් මගෙහි සංධිස්ථානයන් | 05 |
| 1.4 | සභාපතිතුමාගේ සමාලෝචනය | 07 |
| 1.5 | සමාගමෙහි සංවිධාන ව්‍යුහය | 09 |
| 1.6 | අධ්‍යක්ෂ මණ්ඩලය හා පාලන කමිටු | 10 |
| 1.7 | ආයතනික යහපාලනය | 11 |
| 1.8 | ආයතනික යහපාලනය උදෙසා සමාගමෙහි දායකත්වය | 12 |
| | | |
| **2.** | අවධානම් කළමනාකරණය | 13 |
| | | |
| **3.** | කාර්යසාධන දත්ත | 16 |
| | | |
| **4.** | මූල්‍ය සමාලෝචනය | 18 |
| | | |
| **5.** | පසුගිය අවුරුදු දහය සඳහා මූල්‍ය ප්‍රගතිය | 19 |
| | | |
| **6.** | ආයතනික පාර්ශවකරුවන් වෙනුවෙන් සමාගමෙහි දායකත්වය | 20 |
| | | |
| **7.** | සමාගමේ වෙළඳපොළ කොටස | 21 |
| | | |
| **8.** | සමාගමෙහි මානව සම්පත | 23 |
| | | |
| **9.** | මූල්‍ය වාර්තාකරණය | |
| 9.1 | අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | 25 |
| 9.2 | සභාපතිවරයාගේ හා මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | 26 |
| 9.3 | විගණකාධිපතිතුමාගේ වාර්තාව | 27 |
| 9.4 | විස්තීරණ ආදායම් ප්‍රකාශය | 33 |
| 9.5 | මූල්‍ය තත්ව ප්‍රකාශනය | 34 |
| 9.6 | ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය | 35 |
| 9.7 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 36 |
| | ▪ මූල්‍ය වාර්තාවලට අදාළ සටහන් | 37 |
| | | |
| **10.** | සංස්ථා තොරතුරු | 66 |

1.1

## දැක්ම

"කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නොපමාව නිෂ්පාදනය කොට බෙදා හැරීම මඟින් ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ධනාත්මකව දායකත්වය සපයමින් රාජ්‍ය අංශය සතු ආදර්ශමත් ආයතනයක් වශයෙන් ක්‍රියා කිරීම."

## මෙහෙවර

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පොහොර නිෂ්පාදකයා හා බෙදා හරින්නා බවට පත්වෙමින් රජයේ කෘෂිකර්මාන්තය සඳහා වූ දැක්මේ සාඩම්බර හිමිකරුවෙක් වෙමින්
නිෂ්පාදන විවිධාංගීකරණය, උසස් තත්වයේ නිෂ්පාදන එළිදැක්වීම
සහ
ආයතනයේ පාර්ශවකරුවන්ගේ සියළු අවශ්‍යතාවන්ට විවෘතව කටයුතු කරමින්
ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවස්ථාව උදාකර ගැනීම".

## 1.2 අප සමාගමෙහි සාරධර්මයන්

| අවංකභාවය | වගවීම | අන්‍යෝන්‍ය ගරුත්වය |
|---|---|---|
| සෑම අවස්ථාවකදීම විනිවිද භාවයක් යුක්තව කටයුතු කිරීම සහ ආචාර ධර්මයන්ට අනුකූල වීම | අපගේ සියළුම ක්‍රියාවන් සහ ප්‍රතිඥාවන් සඳහා වගකීම දැරීම. | එකිනෙකාට ගරු කිරීම, සමානාත්මතාවය, පුද්ගල සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රගතීන් ඇගයීම. |

| යහපත් පුරවැසිභාවය | ගුණත්වය | සාමූහික ප්‍රයත්නය |
|---|---|---|
| නීතිගරුක වීම, සාමාජීය යහපැවැත්මට දායක වීම සහ සමාගමෙහි සියළුම ක්‍රියාවන් වෙනුවෙන් පාරිසරික වගවීම | සමාගමෙහි සියළුම කාර්යයන්හි සහ නිමැවුම්හි උපරිම ගුණත්වය සුරැකීම. | සමාගමෙහි පොදු දැක්ම වූ “දියුණුව“ කරා සාමූහිකව ගමන් කිරීමට පුද්ගලික වශයෙන් කැපවීම. |

## 1.3 අප ගමන් මගෙහි සංධිස්ථානයන්

**1872**

- දිවයිනෙහි සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු වස්, සමාගම මහා බ්‍රිතාන්‍යයේ සංස්ථාපනය කරන ලදී.

**1976**

- 1971 අංක 35 දරණ ව්‍යාපාර පවරා ගැනීමේ ආඥා පනත ප්‍රකාරව සමාගම ශ්‍රී ලංකා රජය විසින් පවරා ගන්නා ලදී.
- සමාගමෙහි නම “ජනසතු කොට රජය විසින් පවරා ගත් සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම“ ලෙස වෙනස් කෙරිණි.

**1989**

- 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හා ව්‍යාපාර පොදු ව්‍යාපාර බවට පත් කිරීමේ පනතට අනුකූලව සමාගම පොදු ව්‍යාපාරයක් බවට පත් කරන ලදී.
- සමාගමෙහි නම සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ලෙස වෙනස් කරන ලදී.
- සමාගම එහි සංපූර්න කොටස් ප්‍රාග්ධනය 100,000,000 මහා බාන්ඩාගාරයට නිකුත් කළේය

**1994**

- එවකට ගෙන ගිය පෞද්ගලිකරණ ප්‍රතිපත්තියට අනුව සමාගම පෞද්ගලීකරණය කරන ලදී. සමාගමෙහි කොටස් ප්‍රාග්ධනයෙන් 90%ක් පුද්ගලික කළමනාකාරිත්වයකටත් ඉතිරි 10% මහා භාණ්ඩාගාරයටත් හිමි විණි. එනමුත් පාලනාධිකාරියේ ඇති වූ අර්බුද හා දැවැන්ත සේවක විරෝධතා හමුවේ සමාගමේ මෙහෙයුම් කටයුතු වසර දෙකක කාලයකට ඇණ හිටිණි.

**1997**

- 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යාපාර පුනරුත්ථාපන පනතට අනුකූලව සමාගම නැවතත් රජයට පවරා ගන්නා ලදී. ආයතනය පාලනය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් "නිසි බලධාරි" වරයෙක් පත් කරන ලදී.
- සමගමේ ප්‍රධාන කාර්යාලය යූනියන් පෙදෙසේ සිට වත්තල හුණුපිටියේ වත්මන් ස්ථානයට ගෙන යන ලදි

අපගේ ගමන්මගේ සංධිස්ථාන...

**2005**

- මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ සහනාධාර මිලට වී සඳහා පොහොර බෙදා හැරීම ආරම්භ කරන ලදී.

**2010**

- අනෙකුත් බෝග වර්ග සඳහා ද සහනාධාර පොහොර බෙදා හැරීම ආරම්භ කරන ලදී.

**2011**

- නිසි බළධාරිවරයෙක් යටත් තිබූ සමාගමෙහි පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතට පත් කරන ලදී.

**2016**

- පැවති පොහොර සහනාධාර ක්‍රමයට ආදේශක ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දීමෙන් අනතුරුව සමාගම තරඟකාරී විවෘත වෙළඳපළට අවතීර්ණ වුණි.

**2018**

- විවෘත වෙළඳපළ ක්‍රමයේ නැවතත් සහනාධාර පොහොර බෙදා හැරීම සඳහා අවතීර්ණ විය.

**2021**

- දේශීය කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම පිණිස රසායනික පොහොර භාවිතය අත්හිටුවමින් රජය විසින් සිය පොහොර සහනාධාර ප්‍රතිපත්තිය වෙනස් කරන ලදී.

**2023**

- රජය විසින් රසායනික පොහොර සඳහා යොදවා තිබූ සීමා කිරීම් ඉවත් කිරීමෙන් අනතුරුව සමාගම නැවතත් රසායනික පොහොර බෙදා හැරීමේ කාර්යභාරයට අවතීර්ණ විය.

**2023**

- කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ රජය සතු ලංකා පොහොර සමාගම ඒකාබද්ධ කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දෙන ලදී.

## 1.4 සභාපතිතුමාගේ සමාලෝචනය

**සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අප සමාගමෙහි වර්ෂ 2024 ක් වූ මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට අදාල වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරමි**

*කර්මාන්ත දළ විශ්ලේෂණය*

2023 වර්ෂය ශ්‍රී ලාංකීය පොහොර වෙළඳපළ සඳහා අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් විය. රටෙහි ආර්ථික තත්ත්වය, රාජ්‍ය ප්‍රතිපත්ති සහ ගෝලීය පොහොර වෙළඳපළ තත්ත්වයත් මෙම අභියෝගාත්මක තත්ත්වය සඳහා හේතුකාරක විය.

වර්ෂ 2022 දී මුහුණ දුන් දැඩි ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාව තවමත් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. භෝග නිෂ්පාදනය සඳහා පොහොර මත වැඩි වශයෙන් රඳා පවතින අප කෘෂිකාර්මික අංශය මෙම ආර්ථික පසුබෑම හමුවේ දැඩි අභියෝගයන්ට ලක්විය. 2022 වර්ෂයේ රසායනික පොහොර තහනම් කර කාබනික වගාව ප්‍රචාරණයට රජය ගත් හදිසි තීරණය කෘෂිකර්මාන්තයේ සැලකිය යුතු බිඳ වැටීමට හේතු කාරක විය. එහෙයින් වර්ෂ 2023 දී ප්‍රතිපත්තිය නැවතත් වෙනස් කරමින් රසායනික පොහොර භාවිතය යළි ස්ථාපිත කරනු ලැබුවේ කෘෂි නිෂ්පාදනය යාමනය කිරිම අරමුණ පෙරදැරි කරගෙනය.

විරෝධතා ව්‍යාපාර සහ භෝග අස්වනු වලට ඇති වූයේ ඍනාත්මක බලපෑම් සැලකීමෙන් අනතුරුව රජය විසින් රසායනික පොහොර තහනම ඉවත් කරන ලදී. පොහොර හිඟකම හේතුවෙන් අඩු වූ අස්වැන්න සමඟ පොර බඳිමින් සිටි ගොවි ජනතාවට මෙම ප්‍රතිපත්තිමය වෙනස ඉමහත් අස්වැසිල්ලක් විය. පොහොර සඳහා වැයවෙන පිරිවැය අවම කිරීමේ අදහසින් රජය විසින් ගොවිජනතාව වෙත සහනාධාර පහසුකම් ලබා දෙන ලදී.

දේශපාලනික ආතතීන් ගෝලීය පොහොර සැපයුම් දාමය වෙත තවමත් බලපෑම් එල්ල කරමින් සිටි. විශේෂයෙන්ම ගත් කල පවත්නා රුසියානු යුක්රේන අර්බුදය හුවා දැක්විය හැක. මෙම අර්බුදකාරී තත්ත්වය තුළින් පොහොර මිල ඉහළ යාම මෙන්ම පොහොර නිශ්පාදන සීමාසහිත වීම සිදුව ඇත.

ශ්‍රී ලංකාවේ පොහොර සැපයුම වැඩි වශයෙන් ආනයනය මත රඳා පවත්නා බැවින් ඉහත තත්ත්ව යටතේ පොහොර සඳහා වැයවන පිරිවැය ඉහළවීම, ඇතැම් විට පොහොර හිඟතාවයට මුහුණ දීමට අපහට සිදුවඇත.

ශ්‍රී ලාංකීය ගොවිජනතාව බලපෑම් එල්ල කරමින් පොහොර මිල, ගෝලීය පොහොර මිලට සමානුපාතිකව කැපී පෙනෙන ලෙස ඉහළ නැංවිනා. ගොවි ජනතාවට දැරිය හැකි මිලකට ස්ථාවර පොහොර සැපයීමට ඇති හැකියාව මෙම ඉහළ නගින පොහොර පිරිවැය සහ රට තුළ පවත්නා විදේශ විනිමය හිඟය මගින් දැඩි ලෙස අභියෝගයන්ට ලක් විය.

පොහොර වෙළඳපළ ස්ථාවර කිරීම සඳහා ඉන්දියාව, ආසියානු සංවර්ධන බැංකුව වැනි රටවල් සහ ආයතන මගින් පොහොර ආනයනය සඳහා ආධාර සහ ණය පහසුකම් ලංකාව වෙත ලැබිනා. මෙසේ ලද බාහිර සම්පත් පොහොර සැපයුමෙහි තිබූ අඩුපාඩු යම් දුරකට සමනය කිරිමට සමත්විය.

*ආයතනයේ කාර්ය සාධනය*

මූල්‍ය ප්‍රකාශන වාර්තා වූ කාලයට අදාළව සමාගම රුපියල් මිලියන 260 ක පිරිවැටුමක් අත්පත් කොටගෙන ඇත. භාණ්ඩ හා සේවා විකිණුම්ද ඇතුළත්ව ආයතනයේ සිදුවූ සිදුවූ සියළුම මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ආදායම මෙම පිරිවැටුමෙන් පිළිඹු කරයි. සමාගමෙහි දළ ලාභය රුපියල් මිලියන 118ක් වූ අතර ශුද්ධ ලාභය රුපියල් මිලියන 293 කි. සියලුම ආයතනික වියදම, බදු සහ පොලීවලින් පසු සමාගමෙහි ඉපයීම මෙයින් නිරූපණය කෙරේ.

ජාත්‍යන්තර ආධාර ක්‍රමය යටතේ ලද පොහොර බෙදා හැරීමට රජයට සහාය පළකිරීම මගින් ආහාර සුරක්ෂණය ඇති කිරිම සහ ගොවිජනතාවට සහාය පළ කිරීමෙහි ලා අප සමාගම ප්‍රධාන කාර්යභාරයක්

සිදුකර ඇත. මෙම සහ සම්බන්ධතා යටතේ කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහල නැංවීම, භෝග අස්වනු වැඩි දියුණු කිරිම සහ ගොවි ප්‍රජාවගේ ජීවන මට්ටම තිරසර කිරීම අප සහාය පලකර ඇත. අපගේ මෙම උත්සාහය හරහා දේශීය ආර්ථිකයට සහ ප්‍රජාවට ධනාත්මක තත්ත්වයක් ස්ථාවර ආහාර සැපයීමක් ඔස්සේ ලබාදීමට හැකියාව ලැබුණි.

ආර්ථික අභියෝග හමුවේ වුවද ශ්‍රී ලංකා රජයේ මග පෙන්වීම ඔස්සේ මිශ්‍ර පොහොර (ප්‍රධාන වශයෙන් තේ පොහොර) වෙළඳපළ තුළ සිය කොටස සනිටුහන් කිරීම අප සමාගම සමත් විය. සුළු පරිමාණ තේ ව්‍යාවසායකයන් හට සහන මිලට පොහොර සැපයීම මගින් රටේ ආර්ථිකය වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම දිරිමත් කරනුවස් අප සමාගම තේ සංවර්ධන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹියේය.

<u>*සමාජ වගකීම*</u>

මෙම අර්බුදකාරී කාලච්ඡේදය වුවද ජාතික කෘෂිකර්මාන්තය සවි බල ගැන්වීම, ගොවි ජනතාවගේ මෙහෙයුම් කටයුතු සමඟ මුසු වෙමින් සහ සහය පලකිරීම් මගින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම යන කාර්යයන් පෙර පරිදිම අප සමාගම් මගින් සිදු කරන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ලා ප්‍රධාන ආයතනයක් වන අප සමාගමට නිසි කලට වේලාවට, හිඟකමකින් තොරව ගොවියා වෙත පොහොර බෙදා හැරීම මගින් රජයට සහ මහජනතාව වෙත උපරිම දායකත්වය ලබා දී ඇත. තවද අප රටෙහි කෘෂිකර්මාන්ත සංවර්ධනයේදී අප සමාගම ප්‍රධාන භූමිකාවක් වූ බව සඳහන් කරනු කැමැත්තෙමි.

<u>*ධනාත්මක ඉදිරි දැක්ම*</u>

සවිමත් මූල්‍ය තත්ත්වයකට හිමිකම් කීම, සියවසකට අඛණ්ඩ වෘත්තිමය නිපුණත්වයෙන් පිරිපුන් මානව සම්පත සහ රජයේ සවිමත් පිටුබලය අප සමාගමේ වර්ධනයට ශක්තිමත් පාදමක් සාදයි.

වසර 2022 දී ශ්‍රී ලංකාවේ කෘෂි ක්‍රියාකාරකම්හි සිදුවූ 4.2% ක සංකෝචනය උඩියටිකුරු කරමින් වර්ෂ 2023 දී කෘෂි ක්‍රියාකාරකම් හි අගය එකතු වීම් 2.6% කින් ඉහළ ගොස් ඇත. විශේෂයෙන්ම පොහොර අනෙකුත් කෘෂි රසායනික ආදාන සහ ඉන්දන සැපයුම්හි සිදු වූ වර්ධනය මේ සඳහා රුකුලක් විය. ඒ හරහා සිදු වූ අස්වනු, පලතුරු, එළවළු භෝග වර්ධනය ධීවර කර්මාන්තය දියුණු වීම් ඉහත වෙනසට හේතු කාරකවිය.

<u>*ස්තුතිය*</u>

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අප සමාගමෙහි සේවක මණ්ඩලයට මේ අවස්ථාවේදී මම කෘතඥ වෙමි. ඔවුන්ගේ පරිශ්‍රමය, දැඩි කැපවීම හා කාර්යක්ෂමතාව අප සමාගම ඉහළට ඔසවා තැබීමට සමත් විය.

සමාගමේ අරමුණු කරා ළඟා වීමේ දී අධ්‍යක්ෂක මණ්ඩලයක් ලද සහයෝගය සහ දායකත්වයද ඉතා අගය කොට සළකන අතර, ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකතුමා ඇතුළු කාර්යමණ්ඩලය ලබා දුන් සහයෝගය සහ මඟ පෙන්වීම සඳහා ස්තුති කරමි.

එසේම, ගරු කෘෂිකර්මාන්ත ඇමතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශයේ සේවක මඩුල්ල, ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්, සියළුම ගොවිජනසේවා නිළධාරින් සහ මහජනතාව අප සමාගම වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් අතිශය කෘතඥ වෙමි.

තවද අපගේ ආනයන බිල්පත් නිසි වේලාවට පියැවීමට සහයෝගය ලබා දුන් මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂක ජනරාල් සහ සියළුම සේවක මඩුල්ල වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරන අතර, අවසන් වරට අපට සහයෝගය ලබා දුන් සියළුම බැංකුකරුවන් සහ අප ආයතනයේ සියළුම පාර්ශවකරුවන්හට මාගේ ගෞරවනීය කෘතඥතාව පළ කරමි.

සභාපති

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

## 1.5 සමාගමේ සංවිධාන ව්‍යුහය



## 1.6 අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලන කමිටු

**අධ්‍යක්ෂ මණ්ඩලය**

සභාපති - ආචාර්ය ජගත් පෙරේරා

අධ්‍යක්ෂ - කේ.ඒ.ඩබ්ලිව්. ප්‍රනාන්දු මිය

අධ්‍යක්ෂ - කළු දූරගේ සුනන්ද ලාල් මයා

අධ්‍යක්ෂ - එච්.ඒ. කුමාර මයා

අධ්‍යක්ෂ - ටී. සුසිල් සිරිනන්දන ද සිල්වා මයා

අධ්‍යක්ෂ - එස්.එල්. පරණමාන්න මයා

සමාගම් ලේකම් - ඒ.එම්. චමිලා එස්. තිලකරත්න මිය (නීතිඥ)

**විගණන හා කළමණාකරණ කමිටුව**

සභාපති - කේ.ඒ.ඩබ්ලිව්. ප්‍රනාන්දු මිය

- සාමාජික - එච්.ඒ. කුමාර මයා
- **සාමාජික** - ඊ. ඩබ්ලිව්. ජී. කේ. ප්‍රියදර්ශන මයා
- **සාමාජික** - කළු දූරගේ සුනන්ද ලාල් මයා
- **නිරීක්ශක** - ජී.කේ.යූ. අබේරත්න මිය

**ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව**

මුදල් හා පරිපාලන කළමණාකරු - එස්.එන්.ජේ. වික්‍රමසිංහ මයා

අළෙවි කළමනාකරු -ජේ.ජී.යු. වික්‍රමපාල මයා

ක්‍රියාකාරී ප්‍රතිසංස්කරණ සහ බෙදාහැරීමේ කළමනාකරු - ජී.ටී.පී. සේනානායක මයා

## 1.7 ආයතනික යහපාලනය

රාජ්‍ය අංශයට අයත් වන ආයතනයක් වන අප සමාගමෙහි සියළුම ක්‍රියාවන්හි පදනම වනුයේ අප විසින් අනුගතව ඇති ආයතනික යහපාලනයයි. සමාගම පාලනය කෙරෙන සියළුම නීති රීති හා ක්‍රියා විධි වලින් සමන්විත පාලන පද්ධතිය, ආයතනික යහපාලනය ලෙස කැටි කොට දැක්විය හැක. අප සමාගමට බල පැවැත්වෙන සියළුම නීති රීතින්ට යටත්ව, සමාගමෙහි සියළුම පාර්ශ්වකරුවන්ගේ අභිප්‍රායන් තුලනය කිරීමේ කර්තව්‍යයේ දී අපගේ ආයතනික යහපාලනය සිය ප්‍රධානතම මෙහෙය ඉටු කරනු ලබයි. අප සමාගම විසින් රජය නියෝජනය කරනු ලැබේ. එහෙයින් යහපත් ආයතනික යහපාලනයක් පවත්වා ගැනීම අපගේ ප්‍රධානම වගකීම වෙන අතර ඒ සඳහා ඉමහත් පරිශ්‍රමයක් දැරීමට අප හට සිදු වේ. මෙය අප සමාගමට ඇති ප්‍රධාන අභියෝගයකි. එහෙයින් සමාගමෙහි සියළුම කටයුතු, පවතින ආචාර විධින්ට ඉහළින්ම අනුගත වන බවටත් ඒවා සමාගමෙහි දියුණුව සඳහාම සිදු කෙරෙන බවටත් සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය නිරතුරුවම සහතික වෙනු ලැබේ.

<u>ආයතනික යහපාලන ආකෘතිකමය රාමුව</u>

| <u>පාලන රාමුව</u> | <u>ආරක්ෂණය</u> | <u>අභ්‍යන්තර පාලන සැලැස්ම</u> |
|---|---|---|
| 2007 අංක 07 දරණ සමාගම් පනත | මහා භාණ්ඩාගාරය | කොටස්කරුවන් |
| 1971 අංක 31 දරණ මුදල් පනත | රේඛීය අමාත්‍යාංශය | අධ්‍යක්ෂ මණ්ඩලය |
| 1995 අංක 15 දරණ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත | විගණකාධිපති දෙපාර්තමේන්තුව | විගණන හා කළමණාකරණ |
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහ පාලනය සම්බන්ධ | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය | ජෝෂ්‍ය කළමණාකරණ |
| | | අභ්‍යන්තර පාලනය |
| | | අභ්‍යන්තර විගණක |

## 1.8 ආයතනික යහපාලනය උදෙසා සමාගමෙහි දායකත්වය

**අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්**

•ගත වූ වසර තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇත.

**සේවක මණ්ඩල අවශ්‍යතා**

❿සියළුම සේවක මණ්ඩල අවශ්‍යතාවයන් සහ උසස්වීම් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව වේ. .

**ප්‍රතිපත්ති තීරණ**

•සියළුම ප්‍රතිපත්ති තීරණ හා පුළුල් උපයාමාර්ගයන් අධ්‍යක්ෂක මණ්ඩල සාකච්ඡාවට බඳුන්ව නිර්නය කරනු ලැබේ.

**සුවිශේෂ කරුණු**

❿සියළුම වැදගත් හා සුවිශේෂි කරුණු කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට යටත්ව සිදු වේ.

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

❿සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06ක් පවත්වා ඇත. .

**කාර්යභාර සැළසුම් කිරීම**

❿ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵල ඵලදායි ලෙස ලඟා කර ගැනීම සඳහා ආයතනයේ කාර්යභාර සැලැස්ම ඉහළ කළමනාකාරිත්ව කමිටුව මඟින් සිදු කරනු ලැබේ.

## 2. අවදානම් කළමනාකරණය

අවධානම් කළමනාකරණය යනු අවධානම් පුරෝකථනය, ඇගයීම සහ ඒවාහි බලපෑම අවම කිරීමට විවිධ ක්‍රමවේද හඳුනා ගැනීමේ ක්‍රියාවලියයි. සියළුම අවධානම් මග හැරීමේ ප්‍රතිඵලය කිසිඳු ප්‍රගතියක් හෝ කිසිඳු ජයග්‍රහණයක් නොවිය හැක. ඒ නිසා සමාගමෙහි අවධානම් කළමනාකරණ උපාය මාර්ග අධ්‍යක්ෂක මණ්ඩලයේ නිරන්තර සුපරීක්ෂණයට යටත් වෙන අතර, අවධානම් අවම කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද සැකසීම සමාගමේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරයි. පනවා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් නිසි පරිදි අනුගමනය කරන්නේ ද යන්න තහවුරු කර ගැනීමට අභ්‍යන්තර විගණන අංශය විසින් සාමාන්‍ය හා විශේෂ විමර්ෂණ කටයුතු සිදු කර ලුහුඬුකම් ඇත්නම් අධ්‍යක්ෂක මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.



| සම්භාවිතාව | | | | |
|---|---|---|---|---|
| ඉහළ | | | 2 ,9 | 5,8 |
| මධ්‍යම | | | 3,15 | 1 ,4 ,6 ,10 ,14 |
| සුළු | 7 | | | |
| ඉතා සුළු | | 11 | 13 | 12 |
| | සුළු | මධ්‍යම | ඉහළ | ඉතා ඉහළ |

අප සමාගම විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අවධානම් මෙසේ සාරාංශගත කළ හැක.

බලපෑම

| අනු අංකය | අවදානම | අවදානම් ප්‍රතිචාර |
|---|---|---|
| 01 | ලෝක වෙළඳපොලෙහි පොහොර මිල ඉහළ නැගීම | මිල වෙනස්වීම් අඛණ්ඩව අධ්‍යයනය කිරීම සහ වාසිදායක මිල සටහන් වන විට මිලදී ගැනීම. |
| 02 | අතිශය තරඟකාරී වෙළඳපොළ තුළ තරඟකරුවන් අභිබවා යෑමට උපායමාර්ග සැළසුම් කිරීමේ දී රාජ්‍ය සමාගමක් වීම හේතුවෙන් විෂය පථය සීමා වීම. | අවධානම පිළිගැනීම සහ පාලන රාමුව තුළ ගොඩනැගිය හැකි උපායමාර්ගයන් උපරිමව යොදා ගැනීම එමෙන්ම නිසි අනුමැතියක් යටතේ ආයතනය සඳහා විශේෂිත මෙහෙයුම් ක්‍රමවේදයක් සකස් කිරීම. |
| 03 | රසායනික පොහොර හේතුවෙන් සිදු වන සෞඛ්‍යයට අහිතකර බලපෑම් හේතුවෙන් ගනුදෙනුකරුවන්ගේ පොහොර සඳහා ඇති ඉල්ලුම අඩු වීම. | කාබනික පොහෙර වෙළඳපොළට අවතීර්ණ වීම. අනවශ්‍ය ආකාරයෙන් පසට රසායනික ද්‍රව්‍ය එකතු වීම වැළැක්වීම සඳහා එක් එක්පසට විශේෂිත පොහොර මිශ්‍රණ සැකසීම. |
| 04 | නව රාජ්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදීම සහ පවතින ප්‍රතිපත්තීන් වෙනස් කිරීම. | අවධානම පිළිගැනීම සහ රාජ්‍ය ප්‍රතිපත්ති අඛ සුපරීක්ෂණය කරමින් ආයතනයේ උපාය එයට අනුකූලව සීරුමාරු කිරීම. |
| 05 | රජය විසින් සිදු කරන මිල පාලනය | |
| 06 | ආයතනය විසින් පූර්ව සැළසුම් නොකරන ලද පොහොර තොග රජය විසින් ප්‍රසම්පාදනය කර බෙදා හැරීමට බාර දීම. | |
| 07 | ප්‍රසම්පාදන කටයුතු සඳහා වැඩි කාලයක් ගත වීම. | |
| 08 | නිරවද්‍ය සහ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා සුදුසු තොරතුරු තාක්ෂණ පද්ධතියක් ආයතනය සතු නොවීම. | අවධානම අවම කිරීම සඳහා පිළිගත් පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම. |
| 09 | ආයතනය සඳහා පිළිගත් මෙහෙයුම් පටිපාටියක් නොවීම සහ පවතින ක්‍රියා පටිපාටියන්හි ඇති අකාර්යක්ෂමතා | අවධානම් අවම කිරීම සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් හඳුන්වා දීම. |

| *අනු අංකය* | *අවදානම* | අවදානම් ප්‍රතිචාර |
| --- | --- | --- |
| **10** | **අහිතකර කාළගුණික තත්ව හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම අඩු වීමේ අවධානම** | **අයහපත් කාළගුණික තත්ව හේතුවෙන් සිදු විය හැකි අලාභදායි තත්වයන් දරා ගැනිම සඳහා ප්‍රමාණවත් පරිදි ආයෝජනයන් හි නියැලීම.** |
| **11** | **අයුතු වරප්‍රසාද ලබා ගැනීම සඳහා වැරදි හා වංචා සිදු කිරීමේ අවධානම** | **වැරදි හා වංචා සඳහා නැඹුරුවීම් අවහිර වෙන ලෙස සවිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කිරීම සහ යහපත් ආචාරධර්ම සහිත වැඩ පරිසරයක් පවත්වාගෙන යාම.** |
| **12** | **ආයතනයේ මූල්‍යමය බැඳීම් පියවීම සඳහා ප්‍රමාණවත් මූල්‍යම තත්වයක් නොවීම.** | **ආයතනයේ ආදායම් හා වියදම් නිරන්තර සුපරීක්ෂණයට යටත් වීම සහ ගැළපීම. එසේම මහා භාණ්ඩාගාරය හා බැංකු සමඟ සවිමත් සබඳතාවක් පවත්වා ගැනීම.** |
| **13** | **නියමිත කාල සීමාවන් තුළ ණයගැතියන් ණය නොපියවීම හේතුවෙන් පාඩු සිදුවීමේ අවධානම** | **හිඟ හිට ඇති ණය සඳහා නීතිමය පියවර ගැනීම සහ සවිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගෙන යෑම.** |
| **14** | **ආනයන සඳහා ගෙවිය යුතු මිල විදේශ විනිමය අනුපාත වෙනස් වීම මත වැඩි වීමේ අවධානම** | **වැඩි ප්‍රතිශතයක් පොහොර රජය මඟින් ආනයනය කරනු ලබන අතර, ආයතනය මඟින් ආනයනය කරන සුළු පොහොර තොගය සඳහා විනිමය අනුපාත නිරන්තර සුපරීක්ෂණයට ලක් කර වාසිදායක අවස්ථාවන්හි ආනයනය කිරීම.** |
| **15** | **ආයතනයේ මූල්‍ය තත්වය පොලී අනුපාතයේ අහිතකර විචලනයන්ට නිරාවරණය වීම.** | **ආනයන බිල්පත් රජය මඟින් ප්‍රතිපූර්ණය කරනු ලබන හෙයින් පොලී අනුපාතිකයේ අහිතකර විචලනයේ අවධානම ආයතනය පාර්ශවයෙන් බලපානුයේ ආයෝජන සඳහා වේ. පොලී අනුපාතිකයන්හි විචලනයන් නිරන්තර සුපරීක්ෂණයට ලක් කිරීම සහ ආකර්ශණීය පොලී අනුපාතිකයන් සඳහා මූල්‍ය ආයතන හා සාකච්ඡා කිරීම අවධානම් අවම කිරීම සඳහා සිදු කරනු ලැබේ.** |

## 3. කාර්ය සාධන දත්ත




**ආදායම**

**රසායනික පොහොර ආනයනය සඳහා පනවා තිබූ තහනම ගිණුම් වර්ෂය තුලදී ඉවත් කල නමුත් රට තුල පැවති විදේශ විනිමය අර්බුදය හේතුවෙන් පොහොර ආනයනය කිරිම අභියෝගාත්මක විය. 2022/23 වර්ෂයේදී සමාගමේ ආදායම ඉතා විශාල ලෙස පහතට වැටුන නමුත් වර්ෂ 2024 අඟ භාගයේදී අප සමාගම ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ගිවිසුම්ගතව කුඩා තේ වතු සඳහා මිශ්‍ර පොහොර සැපයිම ආරම්භ කිරිම මගින් ආයතනයේ ආදායම පෙර වර්ෂයට වඩා 25% කින් ඉහල නැංවිය හැකි විය.**




ප්‍රස්ථාරය අංක 01: සමාගමේ ආදායම (රු. මිලියන)

දළ ලාභය

**ආයතනයේ දළ ලාභය රු. මි. 118 කි. පූර්ව වර්ෂය හා සසඳන කල මෙය 33%ක පසුබැස්මකි. ඉහල උද්ධමනය හා වැඩි විකිනුම් පිරිවැය මෙ සඳහා හේතුකාරක විය.**




ප්‍රස්ථාරය අංක 02: සමාගමේ දළ ලාභය (රු. මිලියන)

**පරිපාලන වියදම**

**පරිපාලන වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව ඉතා සුළු ලෙස එනම් 1%කින් අඩුවී ඇත. උද්දමනයකාරි තත්ව යටතේ උවද ආයතනය සිය පරිපාලන වියදම් යාමනය කිරිමට සමත්ව ඇත.**




ප්‍රස්ථාරය අංක 03: සමාගමේ පරිපාලන වියදම් (රු. මිලියන)

## බෙදාහැරීමේ වියදම

**තේ කර්මාන්තය සඳහා මිශ්‍ර පොහොර බෙදාහැරීමේ කර්තව්‍යයට සමගාමීව ආයතනයේ බෙදාහැරීමෙ වියදම ඉහල යන ලදී.**




ප්‍රස්ථාරය අංක 04: සමාගමේ බෙදාහැරීමේ වියදම

(රු. මිලියන)

## මූල්‍ය ආදායම සහ වියද

**සමාගමේ මූල්‍ය ආදායම රු. මි. 566 කි. මූල්‍ය ආදායම් තුල ස්ථාවර තැන්පතු හා භාන්ඩාගාර බිල්පත් තුල විචක්ෂණශීලිව සිදුකරන ලද ආයෝජනයන්ට අදාල පොළී ආදාම නිරූපනය කෙරේ.**




ප්‍රස්ථාරය අංක 05: සමාගමේ මූල්‍ය ආදායම් සහ වියදම් (රු. මිලියන)

## බදු පෙර ලාභය

**ආසන්න පූර්ව කාලච්ඡේදයන් පුරාවටම සමාගම තිරසර ලාභ සාක්ෂාත් කර ගැනීමට සමත්ව ඇත. පොලි ආදායම් හි සිදුවු අඛන්ඩ වර්ධනය සමාගමෙහි ශුද්ධ ලාභය වැඩිවීම කෙරෙහි දායකත්වය සපයා ඇත. 2023/24 වර්ෂය සඳහා පොළි ආදායම 42% කින් වර්ධනය වී ඇති අතර එහි ප්‍රතිඵල ලෙස බදු පසු ලාභය 11% කින් වර්ධනය වී ඇත.**




ප්‍රස්ථාරය අංක 06: සමාගමේ බදු පෙර ලාභය (රු. මිලියන)

## 4. මූල්‍ය සමාලෝචනය

| ඉපැයුම් සාරාංශය සහ අනුපාත | | 2024 | 2023 | වෙනස් % |
|---|---|---|---|---|
| ආදායම | රු. මිලියන | 260 | 207 | 26% |
| මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය | රු. මිලියන | -6 | 131 | -105% |
| බදු පෙර ලාභය | රු. මිලියන | 555 | 501 | 11% |
| බදු පසු ලාභය | රු. මිලියන | 293 | 361 | -19% |
| | | | | |
| මෙහෙයුම් ලාභ අනුපාතය | % | (2.31) | 63 | |
| කොටසක ඉපැයුම (මූලික) | | 29.00 | 36 | |
| | | | | |
| **මූල්‍ය තත්ව සාරාංශය සහ අනුපාත** | | | | |
| | | | | |
| මුළු වත්කම් | රු. මිලියන | 17,441 | 21,125 | -17% |
| | | | | |
| මුළු වගකීම් | රු. මිලියන | 13,012 | 17,019 | -24% |
| | | | | |
| කොටස් හිමියන්ට අදාළ හිමිකම් | රු. මිලියන | 4,287 | 3,432 | 25% |
| | | | | |
| ජංගම අනුපාතිකය | වාර ගණන | 2.40 | 2 | |
| ක්ෂණික අනුපාතය | වාර ගණන | 2.19 | 2 | |
| ශුද්ධ කාරක ප්‍රාග්ධනයට විකුණුම් | වාර ගණන | 36.99 | 41 | |
| | | | | |
| | | | | |

## 5. පසුගිය වසර දහය සඳහා මූල්‍ය සමාලෝචනය *(සංඛ්‍යා රු. මිලියන වලින් දක්වා ඇත.)*

| *විස්තීරණ ආදායම් ප්‍රකාශය* | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** | **2024** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 1,566.00 | 1,839.00 | 824.00 | 2,112.00 | 1,156.00 | 1,331.00 | 1,541.00 | 770.00 | 207.00 | 260.00 |
| දළ ලාභය | 206.00 | (8,754.00) | (80.00) | 2,297.00 | 7,747.00 | 148.00 | 220.00 | 209.00 | 177.00 | 118.00 |
| මෙහෙයුම් ලාභය | 377.00 | 185.00 | 53.00 | 61.00 | 10.00 | 28.00 | 163.00 | 128.00 | 131.00 | (7.00) |
| බදු පෙර ලාභය | 436.00 | 252.00 | 70.00 | 407.00 | 306.00 | 261.00 | 313.00 | 234.00 | 501.00 | 555.00 |
| බදු අය කිරීම | 154.00 | 71.00 | 13.00 | 97.00 | 159.00 | 98.00 | 53.00 | 73.00 | 139.00 | 262.00 |
| ශුද්ධ ලාභය | 281.00 | 182.00 | 57.00 | 193.00 | 147.00 | 163.00 | 260.00 | 160.00 | 361.00 | 292.00 |
| | | | | | | | | | | |
| *මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය* | | | | | | | | | | |
| මුළු වත්කම් | 18,752.00 | 17,127.00 | 17,988.00 | 16,115.00 | 15,330.00 | 16,201.00 | 20,418.00 | 22,292.00 | 21,125.00 | 17,441.00 |
| සම්පූර්ණ කොටස් | 1,636.00 | 1,792.00 | 1,844.00 | 1,997.00 | 2,542.00 | 2,778.00 | 3,010.00 | 3,075.00 | 3,432 | 4,287 |
| මුළු වගකීම් | 17,116.00 | 15,335.00 | 16,144.00 | 14,118.00 | 12,787.00 | 13,423.00 | 17,408.00 | 19,216.00 | 17,692 | 13,154 |
| | | | | | | | | | | |
| *මුදල් ප්‍රවාහ ප්‍රකාශය* | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (3,100.00) | 149.00 | (1,094.00) | 4,835.00 | 1,926.00 | (1,252.00) | (4,374.00) | (3,680.00) | 1,759 | 4,530.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල් | 2.00 | 48.00 | 801.00 | (1,311.00) | 738.00 | 624.00 | (43.00) | 92.00 | 85 | (551.00) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිතා කරන ශුද්ධ මුදල් | 3,170.00 | 184.00 | 1,197.00 | (3,637.00) | (2,709.00) | 758.00 | 4,135.00 | 3,479.00 | (1,794) | (4,088.00) |
| | | | | | | | | | | |
| *වෙනත්* | | | | | | | | | | |
| කොටසක ඉපැයීම | 28.16 | 18.10 | 5.68 | 19.53 | 14.76 | 16.29 | 25.99 | 16.08 | 36.12 | 29.280 |
| | | | | | | | | | | |

**6.** සමාගමෙහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතු ඔස්සේ සියළුම ආයතනික පාර්ශවකරුවන් සඳහා අගය එකුතු කිරීමේ ක්‍රියාවලිය

අප වටිනාකම නිර්මාණය කරන ආකාරය ..........

**යෙදවුම්**

මූල්‍ය ප්‍රාග්ධනය
*හිමිකම් රු. මි.. 4,287*
*ණය රු. මි. 13,012*

නිර්මිත ප්‍රාග්ධනය දේපළ, පිරියත හා උපකරණ
රු. මි. *903*

මානව සම්පත් ප්‍රාග්ධනය
*සේවකයින් 129*

සමාජීය ප්‍රාග්ධනය
*ගනුදෙනුකරුවන් - ගො.ජ.සේ. මධ්‍යස්ථාන 557*
*ලියාපදිංචි අලෙවි නියෝජිතයින් - 150*
*ලියාපදිංචි සැපයුම්කරුවන් - 17*

**මෙහෙයුම් අගය එකතු කිරීමේ ක්‍රියාවලිය**

සැපයුම් දාම කළමනාකරණය
මූල්‍ය කළමනාකරණය
ගනුදෙනුකරුවන්ගේ සම්බන්ධතා

ආනයනය
↓
ගබඩා කිරීම
හා මිශ්‍ර කිරීම
↓
බෙදාහැරීම

යහ පාලනය
කාර්යක්ෂම ක්‍රියාවලි
යහපත් කර්මාන්ත සබඳතා

**වර්ෂය තුළ එකතු කළ අගය**

මූල්‍ය සපයන්නන් සඳහා
*රු. මි.4.4*

සේවකයන් සඳහා
*සේවක වියදම් රු. මි. 58*
*ප්‍රසාද හා දිරිදීමනා රු. මි.6*

ගනුදෙනුකරුවන් සඳහා
විකුණුම් රු. මි. 260

සැපයම්කරුවන් සඳහා
*මිලට ගැනුම් රු. මි. 1,506*

රජය සඳහා
*බදු රු. මි. 177*

සමාගමේ රඳවා ගැනීම්
*රු. මි. 292*

## 7. සමාගමේ වෙළඳපොළ කොටස

රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ වෙනස්වීම මත සමාගමේහි රසායනික පොහොර බෙදාහැරීමේ කාර්යභාරය ඇණහිටින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ රසායනික පොහොර වෙළඳපොල බිඳවැටීමකට ලක්විය. කෙසේවෙතත් මෙම කාලච්ඡේදය තුල ලෝක බැංකු ආධාර ක්‍රමය යටතේ ලද පොහොර බෙදාහැරීමේ කාර්යයෙහි අප සමාගම නියැලී සිටින ලදී.

තේ සංවර්ධන මණ්ඩලය හා ලියාපදිංචිව සිටින කුඩා තේ වතු හිමියන් සඳහා විශේෂිත මිශ්‍ර පොහොර නිකුත් කිරිමේ උපායමාර්ගික ගිවිසුමකට සමාගම අනුගත විය. මෙම ගිවිසුම මගින් කුඩා තේ වතු හිමියන්ට සිය අස්වනු වැඩිදියුණු කර ගැනිමට අවශ්‍ය රසායනික පොහොර සහනාධාර මිලකට ලබාදෙන ලදී. මෙම සහයෝගිත්වය කුඩා තේ වගාවන්හි සංවර්ධනය හා ඵලදායිත්වයට සහාය වූවා සේම සමාගමේ අලෙවිය ඉහල නැංවිමටද උපකාරි විය. අපගේ නිශ්පාදනයන් සඳහා වූ ඉහල ඉල්ලුම අප සමාගමෙහි වෙළඳපල තත්වය සවිමත් කිරිමට සමත් විය. තවද තේ කර්මාන්තයෙහි වර්ධනය හා තිරසරභාවය රැක ගැනිමේ ගමනේදී අප ආයතනය පළමුපෙළ හවුල්කරුවෙක් බවට පත් කිරිමටද එය සමත් විය.

මෙම වසරේදී සිදු කළ ශුද්ධ සහ මිශ්‍ර පොහොර බෙදාහැරීම



**ප්‍රස්ථාරය අංක 07 – වාර්ෂික වශයෙන් සිදු කළ ශුද්ධ සහ මිශ්‍ර පොහොර බෙදාහැරීම (මෙට්‍රික් ටොන් අනුව)**

**සමාගමේ ප්‍රදේශීය ගබඩා ජාලය**



## 8. සමාගමෙහි මානව සම්පත

**සමාගමෙහි හදවත එහි සේවකයින්ය. වර්තමානය වන විට අප සමාගමෙහි සාමාජික සංඛ්‍යාව 115කි. සමාගමෙහි ශක්තිය රඳ පවත්නුයේ අප සේවකයන්ගේ දැඩි කැපවීම මතය. ඒ හා සමගාමීව සමාගමද සිය සේවක යහපැවැත්ම පිළිබඳව නිබඳවම අවධානය යොමු කරයි. එලෙසම නිරන්තරයෙන්ම සේවක ඇගයීම් සිදු කරන අතර පවතින සියළුම කම්කරු නීතිරීතින් අප සමාගම විසින් දැඩිව පිළිපදිනු ලබයි.**

**වර්ෂය තුළ සමාගමෙහි මානව සම්පත ඇගයීම**



- **සමාගමේ සේවක ශක්තිය**




**ප්‍රස්තාරය: සමාගමේ සේවක සංයෝජනය**

## මානව ප්‍රාග්ධනයට එරෙහිව මූල්‍ය තොරතුරු විශ්ලේෂණය

| වර්ෂය | **2023/24** | **2022/23** |
|---|---|---|
| එක් සේවකයෙකුට ආදායම (000’) | 2 | 1.77 |
| එක් සේවකයෙකුට ලාභය (000’) | 2 | 3 |
| එක් සේවකයෙකුට පිරිවැය (000’) | 0.5 | 0.6 |
| | | |
| සේවක සංඛ්‍යාව | 115 | 117 |

## 9. මූල්‍ය වාර්තාකරණය

### 9.1 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 වන සමාගම් පනතේ 150 (1) සහ 151 වගන්ති අනුව, වාර්ෂික මූල්‍ය වර්ෂය අවසන් වන විට සමාගමේ ආර්ථික තත්ත්වය සහ වාර්ෂික ලාභ හා පාඩු පිළිබඳ සත්‍ය හා සාධාරණ දෘශ්‍යකෝණයක් දැක්වෙන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශපත්‍ර සකස් කිරීම සඳහා අදාළ නියමයන්ට අනුකූල වීම සහතික කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

එමෙන්ම, 148 වගන්තිය අනුව, යෝග්‍ය ගිණුම් වාර්තා තබා ගැනීම, සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණව හා නිවැරදිව නිරූපණය කළ හැකි ආකාරයෙන් ඒවා සකස් කිරීම සහ එම ප්‍රකාශපත්‍රවල ස්වයංක්‍රීයව හා සුපරිපූර්ණව විගණනය කළ හැකි වන පරිදි සැලැස්වීම සඳහාද අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශපත්‍රවල අවංකභාවය සහ වස්තුවාදය පිළිබඳ වගකීම භාරගනී. මූල්‍ය ප්‍රකාශපත්‍ර සකස් කිරීමේදී, නිවැරදි ගිණුම් ප්‍රතිපත්ති තෝරා ගත් බවත් ඒවා ස්ථිරව ක්‍රියාත්මක කළ බවත්, ගනුදෙනු වල ස්වභාවය සහ අන්තර්ගතය නිවැරදිව දැක්වෙන පරිදි සාධාරණ සහ විවේචනාත්මක තීරණ ලබා දී ඇති බවත් අධ්‍යක්ෂවරුන් තහවුරු කරති.

මෙම මූල්‍ය ප්‍රකාශණ 2007 අංක 07 දරණ සමාගම් පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන ලද බවටද අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරති.

අතිරේකව, මෙම මූල්‍ය ප්‍රකාශපත්‍ර මගින් සමාගම් පනත මඟින් අවශ්‍ය කරන සියලුම තොරතුරු සපයා ඇත.

තවද මෙම මූල්‍ය ප්‍රකාශණ සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරනු ලබන අතර. අධ්‍යක්ෂවරුන් තමන් සතු සමාගම පිළිබඳ දැනුම, ප්‍රධාන මෙහෙයුම් හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ නිශ්චිත තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන එම පදනම මත පිළියෙල කර ඇත.
සමාගමේ වත්කම් සුරැකීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුබුන්වත්භාවය පිළිබඳව පරීක්ෂාවෙන් සාර්ථකව ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමකට පත්වී, සමාගම් පනතේ අංක 56(2) වගන්තිය අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති අතර, යෝජිත ලාභාංශ සම්බන්ධයෙන් නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශණයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාව මගින් පත් කළ විගණකාධිපතිට, මූල්‍ය ප්‍රකාශපත්‍ර පිළිබඳව තමන්ගේ මතයක් ප්‍රකාශකිරීමට අවශ්‍ය ලෙස සැලකූ සියලු පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය සියලු අවස්ථා ලබා දී ඇත.

අනුකූලතාව වාර්තාව

අධ්‍යක්ෂවරුන් තහවුරු කරනුයේ, ඔවුන්ගේ දැනුමට හැකි උපරිමයෙන්, සමතුලිත පත්‍රයේ දිනයට අදාලව සමාගමට අයත් සේවකයින් සහ රජය සම්බන්ධ සියලු නීතිමය ගෙවීම් ගෙවා ඇති බවත්, හෝ එය අදාළ වන ස්ථිතිවලදී වාරික වශයෙන් සැලසුම් කර ඇති බවත්ය.

ඒ.එම්. චමිලා එස්. තිලකරත්න

සමාගම් ලේකම්,
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි
කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

## 9.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මුල්‍ය කළමනාකරුගේ වගකීම් ප්‍රකාශය

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2023 මාර්තු 31 වන දින වත්මන් මුල්‍ය ප්‍රකාශපත්‍ර පහත නියමයන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත,

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුක්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන් සංග්‍රහය

මුල්‍ය ප්‍රකාශණවල, සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මුල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේදී උපයෝගි කර ගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යොදා ගත් බව අපි සනාථ කරමු. කිසිම අපගමනයකින් තොරව නිවැරදි ගිණුම් ප්‍රමිතීන් යොදා ගෙන තිබේ. ඉහල මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කමිටුව සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදි.

වත්කම් සුරැකීමේ. වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ හා අනාවරණය කරගැනීමේ අරමුණෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛණ ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියටද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, ඇගයුමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින් කලට කරන ලද විගණන තුලින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා පටිපාටි නිරන්තරයෙන්ම අනුගමනය වී තිබෙන බවට සාධාරණ සහතික වීමක් සැලසී ඇත. එසේ වුවද ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුලින් සැලසෙන සහතික වීම් කර බැලීමේදී හදුනාගත යුතුවු ආවේනික සීමාවන් තිබේ.

මුල්‍ය ප්‍රකාශපත්‍ර විගණකාධිපති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

.......................................
ආචාර්ය ජගත් පෙරේරා
*සභාපති*

.......................................
එස්.එන්.ජේ.වික්‍රමසිංහ
මුල්‍ය හා පරිපාලන කළමනාකරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒආර්අයි/ඒ/සීසීඑෆ්/2024/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 30 දින

සභාපති
සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

**සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ("සමාගම") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2024 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව ඇති රු.11,165,141,941 ක වෙනත් ලැබිය යුතු ශේෂය තුළ වසර 01 කට වඩා වැඩි දීර්ඝ කාලයක සිට නිරවුල් නොවූ රු.199,373,874 ක ශේෂයන් ඇති අතර මෙම නිරවුල් නොවූ දීර්ඝ කාලීන ලැබිය යුතු ශේෂ සඳහා කිසිඳු වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 28 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.1,409,592,766 ක් වූ පොහොර තොග අගය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගය සම්බන්ධයෙන් සැලකිල්ලට නොගෙන පිරිවැයට පමණක් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) රු.149,581,640ක් වූ ලැබිය යුතු පොලී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ ඇතුළත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආයෝජන ක්‍රියාකාරකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ගොවිජන සේවා මධ්‍යස්ථාන, වෙනත් ආයතන හා පුද්ගලයන් මගින් ණය ගැති ශේෂ පියවීම වෙනුවෙන් ලැබී ඇති මුදල් වෙන් කොට අදාළ ගිණුම් තුළ ගැළපීම් කර කේවල ශේෂ හඳුනාගැනීමට හා කාල විශ්ලේෂණය සම්පූර්ණ කිරීමට නොහැකි වීමෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හි 96 ඡේදයට අනුකූලව හානිකරණ අලාභ සඳහා වෙන් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. 2018 වර්ෂයේදී සිදුකළ හානිකරණ අලාභ වෙන් කිරීම වන රු.37,384,363 ක වටිනාකමම මෙම වර්ෂයේදීද ණයගැති හානිකරණ අලාභ ලෙස ණයගැති ශේෂයෙන් අඩුකොට දක්වා තිබුණු අතර එහි නිවැරදිතාවය විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.

(ඉ) 2024 මාර්තු 31 දිනවන විට සමාගමේ බැංකු ගිණුමට සෘජුවම ලැබී තිබූ එකතුව රු.5,138,726 ක් වූ ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලට ගැළපීම් නොකර තැන්පතු යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඊ) සීමා සහිත ලංකා පොහොර සමාගමට 2024 මාර්තු 31 වන දිනට ගෙවිය යුතු රු.6,360,182 ක මුදල උපචිත වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(උ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ආනයනයකර බෙදාහරිනලද MOP පොහොර තොගයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන ගබඩාවල ඉතිරිව පවතින පොහොර සඳහා මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.166,760,000 ක මුදල මූල්‍ය ප්‍රකාශන තුළ ගෙවිය යුතු වටිනාකමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) සමාගම විසින් නැනෝ නයිට්‍රජන් සැපයුම්කරුට වැඩිපුර ගෙවා ඇති රු.49,846,406 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගතකර ඇති ස්ථාවර තැන්පතු පොලී ආදායම තුළ පෙර වර්ෂයට අදාළ රු.29,586,074 ක පොලී ආදායමද ඇතුළත්ව තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.280,994,295 ක වෙළඳ ණයගැති ශේෂය හා උප ලේඛන අනුව කේවල ණයගැති ශේෂයන්ගේ එකතුව අතර රු.3,586,952,472 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ණයගැති ශේෂ සනාථන ලිපිද විගණනය වෙත ඉදිරිපත් නොවිය.

(ඔ) වර්ෂ 1994 සිට 1997 කාල සීමාව තුළදී ණය පදනම මත විවිධ පෞද්ගලික සමාගම් 15 ක් වෙත පොහොර නිකුත් කිරීම වෙනුවෙන් සමාගමට අය විය යුතු රු.22,053,338 ක් වූ ණය අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර එම වටිනාකමට අදාළව හානිකරණ අලාභ සඳහා වෙන් කිරීමද සිදුකර නොතිබුණි.

(ඕ) භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලී ලෙස 2012 වර්ෂයේ ගිණුම්ගත කරන ලද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පවතින රු.185,830,554 ක ශේෂයක් නැවත අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් තහවුරුවක් ඉදිරිපත් නොවිය.

(ක) 2024 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පිරිවැය රු.19,721,956 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය තොගය භෞතිකව සත්‍යාපනය කර නොතිබූ බැවින් එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයට තහවුරු නොවීය.

(ග) 2014 වර්ෂයේ නැගෙනහිර ප්‍රාදේශීය ගබඩාවෙහි ඇති වූ රු.3,360,430 ක තොග ඌනතාවය වෙනුවෙන් ගබඩා භාරකරුවන්ගෙන් අයවිය යුතු වටිනාකම අයකර ගැනීම සඳහා මේවන විට නඩුකරයක් ක්‍රියාත්මක වෙමින් තිබියදී ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබූ අතර එම වටිනාකම තොග හානි ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව විවිධ ණයගැති ශේෂය තුළ ඇතුළත් කර තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොග ශේෂයේ මෙන්ම අවසාන තොග ශේෂයේද පරිගණක ගත ගිණුම්කරණ පද්ධතිය (ERP) මඟින් පිළියෙල කර තිබුණු තොග වාර්තාවන් හා භෞතික තොග සත්‍යාපන වාර්තා අතර පිළිවෙලින් රු.659,457,661 ක හා රු.476,987,899 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ජ) සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා වැට් බදු වාර්තාව අනුව නිමැවුම් මත එකතු කළ අගය මත බදු (Output VAT) වටිනාකම රු.25,693,035 ක්ද, යෙදවුම් මත එකතු කළ අගය මත බදු (Input VAT) වටිනාකම රු.35,270,829 ක්ද වන අතර ඉදිරියට ගෙන යන යෙදවුම් මත එකතු කළ අගය මත බදු (Input VAT) ශේෂය රු.9,577,794 ක් විය. ලෙජර ගිණුම්වලට අනුව ඉහත ශේෂයන් පිළිවෙලින්

රු.25,070,186 ක්, රු.52,131,731 ක් හා ඉදිරියට ගෙනයන ශේෂය ශුන්‍ය අගයක් වූ බැවින් පිළිවෙලින් රු.622,849, රු.16,860,903 ක වෙනසක් හා ඉදිරියට ගෙන යන යෙදවුම් මත එකතු කළ අගය මත බදු (Input VAT) ශේෂය රු.9,577,794 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ට) ගිණුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු.1,085,300 ක් වූ සේවා හා සම්බන්ධතා ජාලය (Server & Network ) ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ ප්‍රාග්ධනය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඩ) පහත දැක්වෙන ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|---|
| i. | කෙටි කාලීන ණය | 32,488,030 | ණය ශේෂය සම්බන්ධ බැංකු සනාථන ලිපි |
| ii. | පාරිභෝගික තැන්පතු හා අධි ලැබීම් | 27,277,854 | මුදල් ලැබීම් පත්‍රිකා |
| iii. | අයකර ගත හැකි වන්දි මුදල් | 2,273,324 | වන්දි හිමිකම් තහවුරු කිරීමේ ලේඛන |
| iv. | ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (WHT) | 8,446,844. | රඳවා ගැනීමේ බදු වැඩිපුර අයකර ගැනීම සනාථ කෙරෙන ලේඛන |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට

මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ 1.2 කොටසේ 1.2 (ඊ)(උ)(ඌ),(ග),(ප),(ම),2.2.2(අ),2.2.4(අ) යටතේ දක්වා ඇති නිර්දේශයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අනාන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක PED08/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය සමාගම්හි සේවකයින් විසින් ඉතිරි කරගත් නිවාඩු සඳහා දීමනා ගෙවීමේ දී ගෙවීම් සඳහා සළකා බලන වර්ෂයට පෙර වර්ෂයට අදාළව භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ/අයබදු ගෙවා තිබිය යුතු වුවත් සමාගම විසින් 2022/2023 මූල්‍ය වර්ෂයට අදාළ ලාභාංශ භාණ්ඩාගාරය වෙත ගෙවීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සමාන්‍ය සේවකයින් විසින් ඉතිරි කරගත් කෙටි නිවාඩු සහ වෛද්‍ය නිවාඩු සඳහා එකතු වටිනාකම රු.2,571,736 ක දීමනාවක් සහ විධායක ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා රු.1,545,249 ක දීමනාවක් ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

(අ) රසායනික පොහොර ආනයනය කර බෙදාහැරීම සමාගමේ සාමාන්‍ය කර්තව්‍ය වුවත් සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ වෙන්දේසි කිරීමට තිබුණු යූරියා පොහොර මෙ.ටොන් 396.45 ක් රු.56,993,652 කට හා දේශීය පොහොර ආනයනකරුවකුගෙන් යූරියා පොහොර මෙ.ටොන් 1200 ක් රු.207,600,000 කට මිලදීගෙන තිබුණි. දේශීය ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු පිළිවිතරවල සඳහන් වර්ෂ 03 ක අවම පළපුරුද්ද

දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසුකරුගේ ලංසු ලියවිලිවල සඳහන් නොකිරීම නිසා ලංසු ඇගයීමේදී වැදගත් පිරිවිතරයක් සේ නොසලකා හැර ඇගයීම් කමිටුව කටයුතු කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) 2024 මැයි 31 දින වන විටත් ගොවීන් වෙත බෙදාහැරීම සිදුනොකළ 2023 දෙසැම්බර් මාසය වන විට කල් ඉකුත්වී ඇති වටිනාකම රු.3,672,270 ක් වූ නැනෝ නයිට්‍රජන් දියර පොහොර මි.ලීටර් 500 බෝතල් 1,809 ක් සමාගමේ ගබඩාවල සහ වටිනාකම රු.1,423,030 ක් වන දියර පොහොර බෝතල් 701 ක් සීමා සහිත ලංකා පොහොර සමාගමෙහි ගබඩාවල පැවතියද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාගම විසින් වර්ෂය පුරාවට කල්පිරුණු ස්ථාවර තැන්පතු වලින් ලද පොලී මුදල්වල එකතුව රු.416,610,193 ක් නැවත ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. සමාගම සතුව රු.3,637,072,070 ක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද අතිරික්ත මුදල් පවතින පසුබිමක් තුළ සමාලෝචිත වර්ෂයේදී බැංකු අයිරා පහසුකම් ලබාගෙන ඒ සඳහා පොලී ලෙස රු.3,232,997 ක් ගෙවා තිබීම හේතුවෙන් නිසිලෙස මුදල් කළමනාකරණයක් සිදුකර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ සහනාධාර පොහොර නිකුත් කිරීම නතර කොට ගොවීන්ට මුදල් ලබා දීමේ ක්‍රමයට සහනාධාර ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් 2016 පෙබරවාරි 29 දිනට සමාගම සතුව තිබුණු සහනාධාර පොහොර සඳහා රජයේ දායක මුදල වූ රු.2,112,468,040 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකොට පොහොර ආනයනයට ලබා ගත් කෙටි කාලීන ණය මත වූ පොලී වියදම්, මුද්දර හා ලිපිද්‍රව්‍ය ගාස්තු ලෙස රු.780,101,025 ක් ඊට එරෙහිව කපා හැර තිබුණි. ඒ අනුව 2024 මාර්තු 31 දිනට එම භාණ්ඩාගාරයට නොගෙවා රඳවාගත් වටිනාකම රු.1,332,367,014 ක් වී තිබුණි.

(ඈ) 2021 වර්ෂයේදී ආනයනය කරන ලද KCL පොහොර වෙනුවෙන් විදේශීය සැපයුම්කරුට ගෙවිය යුතුව තිබූ ඇ.ඩො.මිලියන 5,707,739.40 ක් විදේශ විනිමය හිඟ වීම මත නියමිත දිනයේදී ගෙවීම්කර නොතිබූ අතර පසුව එම මුදල් සැපයුම්කරු වෙත වාරික වශයෙන් ගෙවීමට එකඟව ඒ සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් සතියකට ඇ.ඩො.මිලියන 250,000 බැගින් සමාගමේ බැංකු ගිණුම වෙත නිදහස්කර තිබූ අතර බැංකු ගාස්තුද ඇතුළුව සැපයුම්කරුට ගෙවිය යුතු සියලුම මුදල් ගෙවා අවසන්කළ පසු

එම ලද මුදලින් විනිමය අනුපාත වෙනස්වීම මත සමාගම සතුව තවදුරටත් රු.31,791,644 ක මුදලක් ඉතිරි වී ඇතත් එය නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) 2018 වර්ෂයේදී රු.3,732,901 ක් වැයකර හම්බන්තොට පිහිටි බදු ඉඩමෙහි ගබඩාවක් ඉදිකිරීම සඳහා ප්‍රාරම්භක වියදමක් සිදුකර ඇතත් මෙම වාර්තාවේ දින දක්වා කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

## 1 සංස්ථා තොරතුරු

### 1.1 ආයතන වාර්තාව

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සීමිත වගකීමකින් යුත් සමාගමක් වන අතර 04-10-1989 දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලදුව 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ 15-07-2011 දින ලියාපදිංචි කල රජය සතු නේවාසික සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වත්තල හුණුපිටිය ලිපිනයෙහි පිහිටා ඇත.

### 1.2 සමාගම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් භෝග සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරණය සිදු කරයි.

### 1.3 මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය

මූල්‍ය ප්‍රකාශසකස් කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. 2023 ජුලි 31 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවෙන් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

### 1.5 සේවක සංඛ්‍යාව

සමාගමේ සේවක සංඛ්‍යාව

| | 2024 මාර්තු 31 දිනට | 2023 මාර්තු 31 දිනට |
|---|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | 16 | 17 |
| ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩලය | 90 | 91 |
| කම්කරුවන් | 9 | 9 |
| | 115 | 117 |

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 ප්‍රකාශයේ අනුමැතිය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරන ලද්දේ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

### 2.2 ඇගයීමේ පදනම

පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය තත්ව ප්‍රකාශණය ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

- ඉඩම් හා ගොඩනැගිලි ( 2019-03-31 දින තක්සේරු කරන ලද)
- ලාභාලාභ තුලින් සාධාරණ මිලට මණිනු ලබන මූල්‍ය සාධන පත්‍ර
- ආයුගණක ඇගයීමෙන් පසු වාර්තා කළ නිර්වචිත ප්‍රතිලාභ බැදීම් වර්තමාන අගයට

### 2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කරනු ලබන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ප්‍රධාන මුදල් ඒකකයද වේ. සෑම මූල්‍ය තොරතුරක්ම ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආසන්නතම රුපියල් අගයට වටයා ඇත.

### 2.4 ඇස්තමේන්තු, නිශ්චය කිරීම් සහ උපකල්පනයන් භාවිතය

ශ්‍රී.ලං.ගි.ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේදී ගිණුම් ප්‍රතිපත්ති භාවිතයට සහ වත්කම් බැරකම් ආදායම් සහ වියදම් වලට බලපාන ඇස්තමේන්තු, තීරණ සහ උපකල්පනයන් කිරීමට කළමනාකාරිත්වයට අවශ්‍යවේ. සත්‍ය ප්‍රතිඵල ඇතැම් විට ඇස්තමේන්තු අගයට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ මූලික උපකල්පනයන් අඛණ්ඩව විචාරනු ලැබේ. ගණකාධිකරණ ඇස්තමේන්තුමේන්තු සඳහා වූ සංශෝධන, එම සංශෝධන සිදුකළ කාළ පරිච්ඡේදයේදී සහ ඒවා බලපාන අනාගත කාළ පරිච්ඡේදයන් වළදී හඳුනාගනී.

**2.4.1** දේපළ. පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය

වර්ෂ **1997** දී සමාගම රජයට පවරා ගන්නා ලද අවස්ථාවේ දී මහා භාණ්ඩාගාරය විසින් පත් කරන ලද කමිටුව විසින් තක්සේරු කරන ලද අගයට සමාගම සිය ඉඩම් අගය කර මූල්‍ය ප්‍රත්‍යාගණන වල පෙන්වනු ලබයි. ඉඩම් පිළිබඳ වැඩි දුර විස්තර සටහන් අංක **18** යටතේ පෙන්නුම් කරනු ලබයි. අනෙකුත් ජංගම නොවන වත්කම් ස්වාධීන තක්සේරුකරුවකු විසින් තක්සේරු කරනු ලදුව **2019.03.31** දිනට ඇති සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශණ වල පෙන්නුම් කරනු ලබයි.

**2.4.2** මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

හානිකරණය පවතින කල වත්කමෙහි ධාරණ අගය හෝ මුදල් උත්පාදන ඒකකය මුදල් අයකරගැනීම ඉක්මවූ විට එහි සාධාරණ වටිනාකම, විකිණීමට දැරූ පිරිවැය හා භාවිතයේ අගයට වඩා එහි සාධාරණ වටිනාකම වැඩිය. පදනම් මත ලබාගත් හැකි දත්ත මත විකිණීමට දැරූ පිරිවැය ගණනයේ එය සාධාරණ අගයට වඩා අඩුය. ස්ථිර විකුණුම් ගණුදෙනු, අතේ දුරින් ඇති ගනුදෙනුවන් සමාන වත්කම් හෝ නිරීක්ෂණ වෙළඳ මිලට වඩා වත්කම් බැහැර කිරීමේ වර්ධන වන පිරිවැය අඩුය. මෙම අගය ගණනය වට්ටම් මුදල් ප්‍රවාහ ආකෘතිය මත පදනම් වේ.

**2.4.3** විශ්‍රාමික ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි පිරිවැය ආයුගණක ඇඟයීමෙන් තීරනය කරණු ඇත. ආයුගණක ඇඟයීමට ඇතැම්විට අනාගත සත්‍ය වර්ධනයන්ට වඩා වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් යොදා ගැනේ. වට්ටම් ප්‍රතිශතයන්, අනාගත වැටුප් වර්ධක සහ මර්ත්‍යතාවය මෙම උපකල්පනයන් වේ. ඉහත උපකල්පනයන් අගය කිරිමේ ඇති සංකීර්ණභාවය සහ ඒවායෙහි කල්පැවැත්මෙහි ස්වභාවය හේතුවෙන් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාමික වගකීම මෙම උපකල්පනයන්හි විචලතාවයන් සඳහා ඉතා සංවේදී වේ. මෙම සියලු උපකල්පන වාර්ථා කරන දිනට අඟයනු ඇත.

**2.4.4** මූල්‍ය සාධන පත්‍ර වල සාධාරණ මිල

මූල්‍ය තත්ව ප්‍රකාශණයන්හි මූල්‍ය වත්කම් බැරකම් වල සාධාරණ මිල වාර්තා කරන විට සක්‍රීය වෙළඳ පොලින් උකහා ගත නොහැකිනම් ඒවායේ සාධාරණ මිල වට්ටම් කළ මුදල් ප්‍රවාහ ආකෘතීන් ඇතුලු ඇගයීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් තීරණය කෙරේ. හැකි විට මෙම ආකෘතීන්ට අවශ්‍ය යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වෙළඳ පොලින් ගනු ලැබේ. නමුත් මෙය ශක්‍ය නොවන විට සාධාරණ මිල තහවුරු කිරීමට යම් මට්ටමක නිශ්චයක් අවශ්‍ය වේ. නිශ්චයන්හි ද්‍රවශීලතා අවධානම, ණය අවධානම සහ මෙම සාධක සම්බන්ධ උපකල්පනයන්ගේ වෙනස් වන ස්වභාවය මූල්‍ය ප්‍රකාශන්හි වාර්ථා කර ඇති සාධාරණ මිලට බලපෑම් කරයි.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මූල්‍ය තත්ව ප්‍රකාශණය සඳහා පහත පැහැදිලි කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති නොකඩවා ව්‍යවහාර කරන ලදි.

**3.1.** විදේශ මුදල්

**3.1.1** විදේශ මුදල් ගණුදෙනු හා ශේෂයන්

විදේශ මුදලින් කෙරෙන ගණුදෙනු සමාගම විසින් ගණුදෙනුව සිදුවන දින ක්‍රියාකාරි තත්කාලීන විනිමය අනුපාතිකව වාර්ථා කරයි. විදේශ මුදලින් මිල අභිධානීකරණය මූල්‍ය වත්කම් හා වගකීම් වන විට වාර්තා කරන දිනට තත්කාලීනව බලපවත්වන අනුපාතිකය අනුව ව්‍යවහාර මුදලට නැවත පරිවර්තනය කෙරේ. පරිවර්තනය නිසා ඇති වන සියලුම ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ.

**3.2.** දේපළ පිරියත හා උපකරණ

එක කාළපරිච්ඡේදයකට වඩා වැඩි කාලසීමාවක් තුල භාවිතය කිරීම සඳහා වූ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා හෝ වෙනත් අයට බදු දීම හෝ පරිපාලන කටයුතු සඳහා යොදාගන්නා ස්පෘශ්‍ය අයිතමයන් දේපළ පිරියත උපකරණ වේ. ඉඩම් හැර අනෙකුත් දේපළ, පිරියත හා උපකරණ ඒවාහි සාධාරණ අගයට අගය කරනු ලැබ ඇත.

**3.2.1** හඳුනා ගැනීමේ පදනම

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් ඇත්නම් සහ වත්කම් වල පිරිවැය විශ්වාසවන්තව මිණිය හැකිනම් දේපළ, පිරියත උපකරණ හඳුනා ගනි.

**3.2.2.** මුල්වරට හඳුනා ගැනීම සහ මිණිම

අදාල වත්කමේ පිරිවැය සහ වත්කම වර්තමාන ස්ථානයට හා භාවිතා කල හැකි තත්වයට පත් කිරීමට අදාල අනෙක් සියළුම පිරිවැයෙහි එකතුව දේපල පිරියත උපකරණ වල පිරිවැය ලෙස සලකනු ලබයි.

ස්ව නිර්මාන වත්කම් වල පිරිවැය ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ පිරිවැය, අදහස් කළ ආකාරයට භාවිතා කළ හැකි තත්වයට ගෙන ඒමට සෘජුවම සම්බන්ධ වන, කොටස් ගැලවීම, සහ අයිතමයන් ඉවත් කිරීම සහ ඒවා තිබූ වැඩ බිම පිළිසකර කිරීම වැනි වෙනත් ඕනෑම පිරිවැයක් ඇතුලත් වේ.

**3.2.3 පසුකාලීන පිරිවැය**

පසුකාලීන පිරිවැය යනු ප්‍රාග්ධනිත කල පමණින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලායාමේ හැකියාවය. එයට කෙරීගෙන යන අළුත්වැඩියා හා නඩත්තු කිරීම් සඳහා දරණ ලද වියදම් ඇතුලත්ය.

**3.2.4 ප්‍රත්‍යාගණන ආකෘතිය**

සමාගමේ ඉඩම් හැර අන් සියළුම දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිත කරනු ලබයි. මෙම දේපළ පිරියත උපකරණ වල අගය 2019.03.31 දිනට ස්වාධීන තක්සේරුකරුවෙක් හරහා තක්සේරු කරනු ලැබිණ.

සමාගමේ දේපළ, පිරියත හා උපකරණ 31.03.2012 ට පූර්ව ශ්‍රී.ල.ගි.ප්‍ර අනුව සැකසූ ප්‍රත්‍යාගණන වටිනාකමට මූල්‍ය තත්ව ප්‍රකාශණයෙහි ගෙනයනු ලැබේ.

**3.2.5 පිරිවැය ආකෘතිය තෝරා ගැනීම**

සමාගමේ ඉඩම් පිරිවැයට අගය කර ඇත. (කාරුණික යොමුව සටහන් අංක 9.3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනස්කම්)

**3.2.6. පොත්වලින් ඉවත් කිරීම**

දේපල පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය පොත් වලින් ඉවත් කරනුයේ එම අයිතමය බැහැරකිරීමකදී හෝ එම අයිතමය භාවිතයෙන් ආයතනයට අනාගත ආර්ථික වාසි අපේක්ෂා කල නොහැකි අවස්ථාවකදීය. මෙම ඉවත්කිරීමකදී ලාභයක් හෝ පාඩුවක් හට ගනී නම් එම ලාභය හෝ පාඩුව ආදායම් ප්‍රකාශණයට ඇතුලත් කරනු ලබයි. දේපල පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගයෙහි ප්‍රතිස්ථාපන පිරිවැයක් හඳුනාගනී නම් ප්‍රතිස්ථාපන කොටසෙහි ඉතිරි ධාරණ අගය පොත් වලින් ඉවත් කරනු ලැබේ.

**3.2.7. ක්ෂය කිරීම**

වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආපසුය. එනම් කළමනාකාරිත්වය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියා කළහැකි තත්වයේ හා ස්ථානයෙහි තිබෙන විටදීය. වත්කමක් විකුණා දැමීම සඳහා තබාගන්නා වත්කම් ලෙස වර්ග කළ දිනය (හෝ විකුණා දැමීම සඳහා වූ ඉවත් කිරීමේ කාණ්ඩයට ඇතුළත් සේ වර්ග කිරීම) සහ වත්කම් ඉවත් කල දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේදී වත්කමක් ක්ෂය කිරීම නවතා දමයි. වත්කමක් සම්පූර්ණයෙන් ක්ෂය කර නැත්නම් වත්කම අක්‍රියව පැවතියද ක්‍රියාකාරි භාවිතයෙන් විශ්‍රාම ගැන්වුවද ක්ෂය කිරීම නවත්වනු නොලැබේ.

ඉඩම් ක්ෂය නොකෙරේ. අනෙක් වත්කම් පහත දැක්වෙන සරල මාර්ග ක්‍රමය අනුව අදාළ ඇස්තමේතු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා විවිධ වර්ගයේ වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමාගම විසින් පරිභෝජනය කරන රටාව පරිදි ක්ෂය කෙරේ.

වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ථා කරණ කාලපරිච්ඡේදයකට වරක් සමාලෝචනය කරයි. වර්තමාන සහ සංසන්දනාත්මක කාළ පරිච්ඡේද වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාල පහත පරිදිය.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| යන්ත්‍රාගාර හා උපකරණ | අවුරුදු 10 |
| මෝටර් රථ | අවුරුදු 08 |
| කාර්යාල උපකරණ | අවුරුදු 05 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | අවුරුදු 05 |
| පරිගණක උපාංග | අවුරුදු 04 |
| මුද්‍රණ යන්ත්‍ර/ෆැක්ස් යන්ත්‍ර | අවුරුදු 04 |
| වායු සමීකරණ | අවුරුදු 05 |

වත්කමෙහි ධාරණ අගය වත්කමෙහි අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි වූ විටෙක එම ධාරණ අගය අයකරගත හැකි වටිනාකම දක්වා වහාම ලියාහරිනු ලැබේ.

**3.2.8.** අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා ලද පරිගණක මෘදුකාංග සහ මෙහෙයුම් පද්ධතිය, එය අත්පත් කර ගැනීමට සහ ප්‍රයෝජනයට ගැනීමට වැය වූ පිරිවැය පදනම් කර ගෙන ප්‍රාග්ධනීත කර ඇත. අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්ත ක්‍රමක්ෂය සහ සමුච්ත අගය අඩුවීම් අඩුකොට මූල්‍ය වාර්තා වල පෙන්නුම් කරයි. මෙම පිරිවැය අදාළ වත්කමෙහි තක්සේරු ප්‍රයෝජනයට ගත හැකි කාලය පුරා ක්‍රමක්ෂය කර පහත පරිදි දක්වා ඇත.

පරිගණක මෘදුකාංග අවු. 03

පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා වූ නඩත්තු පිරිවැය වියදමක් ලෙස එය හට ගන්නා අවස්ථාවේදී ම හඳුනා ගනු ලබයි.

**3.2.9** මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

තොගය හා විලම්භිත බදු හැර සමාගමෙහි අන් ස්ථාවර වත්කම් හි ධාරණ අගය සෑම වාර්තාගත දිනකදී ම හායනකට ලක්ව ඇත් දැයි සමාලෝචනය කරනු ලබයි. හායනය පිළිබඳ කිනම් හෝ අනතුරු ඇඟවීමක් ඇත්නම් අදාළ වත්කම් හි නැවත අය කර ගත හැකි ගණන ඇස්තමේන්තුගත කරනු ලබයි. නැවත අත්පත් කර ගත හැකි වටිනාකම අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ධාරණ අගයට වඩා අඩුකම් වත්කම් හානිකරණයක් හඳුනාගනු ලබයි.

වත්කමෙහි ධාරණ අගය යනු අදාළ වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම සහ වත්කමෙහි සාධාරණ අගයෙන් එහි විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන අගය අතර වෙනස වේ. වත්කමෙහි භාජන වටිනාකම ඇස්තමේන්තු කරන විට එම වත්කමට අදාළ අනාගත මූල්‍ය ප්‍රවාහයක් බදු පෙර වට්ටම් අනුපාතිකයක් යොදා ගනිමින් වට්ටම් කරනු ලැබේ. වත්කම් වල හායනය ගණනය කිරීමේ දී තනිව හායන පරික්ෂාවට ලක් කළ නොහැකි වත්කම්, එම වත්කම් භාවිතයෙන් මූල්‍ය ප්‍රවාහ ජනනය කරන්නා වූ කුඩා කාණ්ඩ වලට ගොනු කරනු ලබයි.

යම්කිසි වත්කමක නැවත අයකර ගත හැකි වටිනාකම එම වත්කමෙහි ධාරණ අගයට වඩා අඩුනම්, වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගය තෙක් අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ හායන අලාභයක් හඳුනා ගනු ලැබේ.

කීර්තිනාමය හැර අන් වත්කම්වල, පූර්ව ගිණුම් කාලච්ඡේද සඳහා හායන අලාභයක් හඳුනා ගැනීමෙන් අනතුරුව වර්තමාන කාලයේ එම හායනයේ අඩු වීමක් හෝ නැවතීමත් හඳුනා ගනු ලබයි නම් පෙරදි හඳුනාගන්නා ලද හායන අලාභය නැවතත් ආපසු ගැළපිය යුතුය. මෙසේ ආපසු ගැළපීමේ දී අදාළ වත්කමෙහි ධාරණ අගය හායන අවධානමක් නොමැති අවස්ථාවේ එම වත්කමෙහි ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයා යුතු ය.

**3.3** ප්‍රාග්ධන නොනිමි වැඩ

වර්ෂය තුල වැය කරණ ලද වාර්තා කරන දිනට නිමි නොකරණ ලද ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන නොනිමි වැඩ ලෙස සලකන අතර වර්ෂය තුල නිම කරණ ලද සහ භාවිත කරන ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

**3.4** ජංගම වත්කම්

මුදල් හා බැංකු ශේෂ සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක් තුල හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලසීමාවක් තුල උපලබ්ධි කර ගත හැකි අයිතම ජංගම වත්කම් ලෙස හඳුනා ගනී.

**3.4.1** තොගය - සෘජු හා මිශ්‍ර පොහොර

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩු කර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලැබීම් පළමු නිකුතු ක්‍රමයටයි. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිලදී ගත් පොහොර පිරිවැයට දක්වා ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට බලාපොරොත්තු වන මිලෙන් එයට අදාල වියදම් අඩුකිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ.

පාරිභෝගික ද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැයට දක්වා ඇත.

3.5. මූල්‍ය උපකරණ

3.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

ආරම්භක හඳුනා ගැනීම සහ මිනුම්කරණය

සමාගම මූල්‍ය වත්කම් හඳුනා ගනුයේ සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශවකරුවෙක් වන අවස්ථාවේදී පමණි. සමාගම එහි මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී වර්ගීකරණය කරයි. මූල්‍ය වත්කම් හඳුනා ගැනීමේදී සෘජුව ආරෝපිත කළ හැකි ගණුදෙනු පිරිවැය වල එකතුව සාධාරණ අගයට මණිනු ලැබේ. කෙසේ වුවත් සාධාරණ අගයට ලාභාලාභ තුලින් වර්ගීකරණය කරන මූල්‍ය වත්කම් සම්බන්ධව සෘජුව ආරෝපිත කළ හැකි ගණුදෙනු පිරිවැය නොසැලකේ.

වර්ගීකරණය සහ පසු මිනුම්කරණය

පළමු හඳුනාගැනීමේදී, සමාගම විසින් මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩ වලට වර්ගීකරණය කරයි.

- අ) කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන
- ආ) ණය සහ ලැබිය යුතු දෑ
- ඇ) ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට අගය කෙරෙන මූල්‍ය සාධන පත්‍ර
- ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය සාධන පත්‍ර

3.5.1.1 කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

ස්ථාවර හෝ නිශ්චය කලහැකි ගෙවීම් සහිත වත්කමෙහි වටිනාකමින් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආයෝජනය කල්පිරෙන තුරු තබාගැනීමේ ආකල්පයක් හා හැකියාවක් ඇත්නම් මෙම කාණ්ඩය තුල වර්ගීකරණය කරයි. මෙම ආයෝජන ජංගම වත්කම් තුල නිරූපණය කරයි.

3.5.1.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ ස්ථාවර හෝ තීරණය කළ ගෙවීම් සහිත සක්‍රිය වෙළඳ පොළක මිළ කියුම් නොලත් සහ සමාගම ක්ෂණිකව හෝ ඉදිරි කාළයේ විකිණීමට බලාපොරොත්තු නොවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මෙම අයිතමයන් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර කල්පිරෙන කාලය වාර්ථාකරණ දින සිට මාස 12ට වැඩි ආයෝජන ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. සහනාධාර ලැබීම්, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් ප්‍රති මිලදී ගැනීම්, ස්ථාවර තැන්පත්, අත්තිකාරම්, තැන්පත්, සේවක ණය සහ මුදල් සහ කාළ පරිච්ඡේදය අවසානයේ මුදලට සමාන වන දේ සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

මූල්‍ය වර්ෂය තුළ ලාභාලාභ තුළින් සාධාරණ අගය යන ගණයට වර්ගීකරණය කළ වත්කම් හඳුනා ගැනීමට නොමැති විය.

3.5.2. පසුකාලීන මිණුම්කරණය

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිණුම්කරණය පහත දක්වා ඇති ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

3.5.2.1. කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල්පිරෙන තෙක් ලග තබාගන්නා ආයෝජන පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනයේදී වත්කම් අත්පත් කරගැනීමේදී හටගත් වට්ටම හෝ අධිහාරයද ගණුදෙණුව සඳහා වැයවූ ගණුදෙණු පිරිවැයද සලකා බලනු ලැබේ.

3.5.2.2. ණය හා ලැබිය යුතු දෑ

සඵල පොලී අනුපාතිකය භාවිතකොට ක්‍රමක්ෂය කරන ලද පිරිවැයෙන් හානිකරණ වෙන්කිරීම් අඩුකලපසු ලැබෙන පිරිවැයට මෙම අයිතම පසු කාලීනව අගය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනයේදී වත්කම් අත්පත් කරගැනීමේදී හටගත් වට්ටම හෝ අධිහාරයද, සඵල පොලී අනුපාතිකය හා සම්බන්ධ අනෙක් පිරිවැයද සලකා බලනු ලැබේ. සඵල පොලී අනුපාතිකයේ ක්‍රමක්ෂය පිරිවැය ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය වියදම් කාණ්ඩය යටතේ ගිණුම් ගත කරනු ලබයි.

3.5.2.3 හඳුනාගැනීම අත්හැරීම

මූල්‍ය වත්කම් හා බැඳුණු ගිවිසුමක අයිතිය සමාගම වෙතින් ඉක්මවූ පසු හෝ වත්කම හා බැඳුණු ප්‍රමාණාත්මක අවදානම් හා වරප්‍රසාද තවත් පාර්ශවයක් වෙත මාරුකල පසු, මෙම වත්කම් ගිණුම් වලින් බැහැර කරනු ලබයි.

මෙම අයිතිය අන්පාර්ශවයකට පැවරීමේ ක්‍රියාවලියේදී අදාල වත්කම හා බැදි පොලී ප්‍රමාණයක් ඒ සමග මාරු නොවූණේ නම් එම පොලී ප්‍රමාණය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ නිරූපණය කරයි. හඳුනාගැනීම අත්හැරීමකදී වත්කමෙහි ධාරණ අගය හා ඒ වෙනුවෙන් ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශයෙහි නිරූපණය කරයි.

**3.5.3** මූල්‍ය වත්කම් වල හානිකරණය
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙන යෑම
ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන වත්කම් සඳහා සෑම වාර්ථාකරණ දිනක් අවසානයේදීම එම වත්කම් වල හානිකරණය පිළිබඳ සුළු හෝ සාක්ෂියක් ඇත්දැයි තනි වශයෙන් හෝ සාමුහිකව පරීක්ෂා කෙරෙන අතර. එබඳු සාක්ෂියක් ඇත්නම් හානිකරණය තක්සේරු කරනු ලැබේ.

වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ එක් සිදුවීමක් හෝ සිදුවීම් කිහිපයක් හේතුවෙන් එම වත්කමෙන් අපේක්ෂිත විශ්වාසිදායි ලෙස ඇස්තමේන්තු කල හැකි අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් වේ නම්, එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් හානිකරණය කරනු ලැබේ. සිදුවූ අලාභය වත්කමෙහි ධාරණ අගය හා අනාගතයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනසින් මණිනු ලැබේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම සතුවූ මුල් සඵල පොළී අනුපාතිකයටය.

ක්‍රමක්ෂය පිරිවැය මත පිරිවැය කරන ලද ණය හා ලැබිය යුතු දෑ සහ කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන සඳහා හානිකරණ පාඩුව ගණනය කරනුයේ වත්කමෙහි ධාරණ අගය හා එම වත්කම හේතුවෙන් අනාගතයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (දැනට හටනොගත් අනාගත ණය හානි හැර) අතර වෙනස මගිනි. මෙම අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරනුයේ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයෙනි. මූල්‍ය වත්කමෙහි ධාරණ අගය ක්‍රමයෙන් අඩුවෙයි නම් අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

පසුකාලීන කාලපරිච්ඡේදයකදී, හානිකරණ අලාභයෙහි ප්‍රමාණය අඩුවේනම් සහ එම අඩුවීම හානිකරණය හඳුනාගැනීමෙන් අනතුරුව හටගත් සිදුවීමක් හා විෂයානුබද්ධ නම්, කලින් හඳුනාගත් හානිකරණ පාඩුව ප්‍රත්‍යාවර්ථ කරනු ලැබේ. (විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි)

**3.6** ඇපකරයන්
පහත දැක්වෙන ස්ථාවර තැන්පතු, පොහොර ආනයනය කිරීම සඳහා විවෘත කරන ලද ණයවර ලිපියන්ට එරෙහිව, මහජන බැංකුවෙහි ආයතනික ශාඛාවෙහි ඇපකරයන් ලෙස තබා ඇත.

| ස්ථාවර තැන්පතු අංකය | වටිනාකම | ණයවර ලිපි අංකය |
|---|---|---|
| 222-60-01-00009791-2 | 50,000,000.00 | රක්ෂණ අරමුදලක් ලෙස පවරා ඇත. |
| 222-60-01-00012080-6 | 150,000,000.00 | රක්ෂණ අරමුදලක් ලෙස පවරා ඇත. |
| 81942328 | 200,000,000.00 | අයිරා පහසුකම |
| 81994288 | 300,000,000.00 | අයිරා පහසුකම |

## 3.7 මූල්‍ය වගකීම්

**3.7.1.** ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

**3.7.1,1** මූල් හඳුනා ගැනීම සහ මැණීම
මූල්‍ය වගකීම් ශ්‍රී.ල.මු.වා.ප්‍ර/ශ්‍රී.ල.මු.ගි.ප්‍ර විෂය පථය තුල මූල්‍ය සාධණ පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශවකරුවෙක් වූ විට පමණක් හඳුනා ගනී. මූල්‍ය වගකීම් මුල් වරට සාධාරණ අගයට හඳුනාගනී. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය වගකීම් ලාභාලාභ මගින් සාධාරණ අගයට සහ වෙනත් මූල්‍ය වගකීම් යන වර්ගීකරණය වර්ග දෙකකින් හඳුනා ගැනියි. සමාගම එහි මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් වර්ග ලෙස වර්ගීකරණය කර ඇත.

**3.7.2.** කපා හැරීම්
මූල්‍ය වත්කම් හා වගකීම් එකිනෙකට එරෙහිව කපා හැර ශුද්ධ අගය මූල්‍ය තත්ව විස්තරයේ දක්වනු ලබනුයේ, සමාගමට ඒ සඳහා නෛතික හිමිකමක් ලැබී තිබෙන විට සහ එහි අභිමතය වත්කම් හඳුනාගත් වහාම ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීම නම් පමණි. ආදායම් හා වියදම් එහි ශුද්ධ අගයට දක්වනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉඩ සලසා ඇති විට පමණක් හෝ එක හා සමාන ගනුදෙනු භාණ්ඩයකින් හට ගන්නා ලාභ හා පාඩු සඳහා පමණකි. උදා:- සමාගමේ වෙළඳාම් කටයුතු.

**3.8** වෙළඳ ලැබිය යුතු දෑ
සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුලදී භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබිය යුතු දෑ වේ. ණය එකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුලදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනීමේදී වෙළඳ ලැබිය යුතු දෑ ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් පසුව වෙළඳ ලැබිය යුතු දෑ හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම්කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක්වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය එකතු කිරීම පිළිබඳ අතීත පලපුරුද්ද ගෙවීම් ප්‍රමාද වීමේ දින ගණන උපරිමය දින 90 ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේදී සලකා බලයි. වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියළුම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ.

තනි තනිව ඇගයීමේ ක්‍රමය: හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

i. විවිධ සේවා සමුපකාර සමිති
ii. ගොවිජන සේවා මධ්‍යස්ථාන
iii. බලයලත් නියෝජිතයන්
iv. රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු

**3.9** මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 ට අඩු කාලයකින් කල් පිරෙන ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

**3.10** ප්‍රකාශිත ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කෙරේ.

**3.11** වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය ගැනුම්, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරාව වෙනත් මූල්‍ය වගකීම්හි ඇතුලත්ය. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගණුදෙණු වටිනාකම වන සාධාරණ අගයට හඳුනා ගනී. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනී.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැදියාව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු වලින් පැණ නැගී වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

**3.12** ණය ගැනුම්

**3.12.1.** මුල් හඳුනාගැනීම

ණය ගැනුම් මූලිකව වාර්තා කල ශුද්ධ ගණුදෙණු වටිනාකමට, සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය වූ වටිනාකමට හඳුනාගනී.

**3.12.2** පසු කාලීන හඳුනා ගැනීම සහ මැණීම

සමාගම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් වර්ගයට වර්ගීකරණය කරයි. එවැනි මූල්‍ය වගකීම් මුල් වරට සෘජුව ආරෝපිත කළ හැකි ගණුදෙණු පිරිවැය එකතු කළ සාධාරණ අගයට හඳුනා ගැනීයි. මුල් වරට පසුව පසු කාලීනව පොළී දරණ ණය සහ ණයට ගැණීම් ඇතුළු මෙම මූල්‍ය වගකීම් සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට මණිනු ලැබේ. වත්කම හඳුනා ගැනීම අත් හැරීම වාසි සහ හානි ලාභාලාභ මගින් හඳුනා ගනී.

.

**3.13** ණය ගැණුම් පිරිවැය

ණය ගැණුම් පිරිවැය, ඒවා වාර්තා කල කාල පරිච්ඡේදයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනී.

**3.14** රාජ්‍ය ප්‍රදාන හා සහනාධාර

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් සහ සමාගම විසින් අදාල කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගනී.

ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාර වලට අදාළ වියදම් එම වියදම දරනු ලබන්නාවූ කාලපරිච්ඡේදයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබඳ සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හඳුනා ගැනේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන ලෙස විලම්භිත රාජ්‍ය ප්‍රදාන ජංගම නොවන වගකීම්වලට ඇතුලත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුල සරල මාර්ග ක්‍රමයට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගනී.

**3.15** වර්තමාන හා විලම්භිත බදු

සමාගම ආදායම් බදු වලට යටත්වේ. සමාගම ස්වතක්සේරු ක්‍රමය මත බදු වගකීම හඳුනාගත්තද අවසාන බදු ප්‍රතිඵලය මුලදී වාර්ථා කළ බදු වලට වඩා වෙනස් විය හැක. මෙවන්වූ වෙනස නිශ්චය කරනු ලබන කාළ පරිච්ඡේදයේ වර්තමාන හා විලම්භිත ආදායම් වත්කම් සහ වගකීම් වලට බලපායි. කාලපරිච්ඡේදය සඳහා අදාළ බදු වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගනු ලබන්නේ ඒවා ඍජුව ස්කන්ධයට හඳුනා ගැනෙන අයිතමයන් හෝ අනෙකුත් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

**3.15.1** වර්තමාන බදු

ගෙවිය යුතු යයි බලාපොරොත්තුවන බදු හෝ වර්ෂය සඳහා වූ බදු අනුපාතය මත හෝ සමාගමට අදාලවන වාර්ථා කරණ කාළ පරිච්ඡේදයට පසුව පනවන ලද නීතී මත පදනම් කර ගණනය කළ ලැබිය යුතු බදු ආදායම් හෝ පාඩු සහ පෙර වර්ෂ වලට ගෙවිය යුතු බදු සඳහා කෙරෙන ගැලපිළි වර්තමාන ආදායම් බදු අය කිරීම් වේ. ස්කන්ධයට ඍජුව අදාළ වන වර්තමාන බදු ලාභාලාභ මගින් නොව ස්කන්ධයෙහි හඳුනාගනී. කළමනාකාරිත්වය බදු අධිකාරින්ට ගෙවිය යුතු යයි බලාපොරොත්තුවන ප්‍රමාණ උචිත වන පදනම මත වරින් වර සමාලෝචනය කරයි.

**3.15.2** විලම්භිත බදු

වත්කම් සහ වගකීම් වල මූල්‍ය පොත් පත්වල සටහන් ධාරණ අගය යන බදු සඳහා ලියාහල අගය අතර, ඇති තාවකාලික වෙනස හේතුකොටගෙන විලම්භිත බදු හඳුනා ගනු ලැබේ. මෙහිදී,

(අ). කීර්තිනාමය පළමුවර හඳුනා ගැනීම හෝ

(ආ). ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් පිළිබඳ මූලික පිළිගැනීම

i. ව්‍යාපාර සංයෝජන සහ
ii. ගනුදෙනු කරන අවස්ථාවේ දී මූල්‍ය හෝ බදු වන ලාභයට බලපෑම් ඇති නොකරන්නා වූ ගනුදෙනු සඳහා මෙම රීතිය වලංගු නොවේ.

වාර්තාකරණ කාලච්ඡේදය අවසන් වන විට පවතින ආදායම් බදු අනුපාතිකය යොදා ගනිමින් විලම්භිත බදු ගණනය කරන අතර, විලම්භිත බදු වන වත්කම් ඇවර කරන අවස්ථාවකදී හෝ විලම්භිත බදු වගකීමක් පියවීම යන අවස්ථාවන්හි දී ද මෙම බදු අනුපාතිකය යෙදා ගනු ලැබේ.

විලම්භිත බදු වත්කමක් හඳුනාගනු ලබනුයේ, අනාගත බදු වන ලාභයක් පවතී යැයි නිශ්චිත අවස්ථාවන් වල පමණි.

වර්තමාන බදු වත්කම් වලට එරෙහිව වර්තමාන බදු වගකීම් කපා හරිනු ලබන්නේ ඒ සඳහා නෛතිකව බලාත්කම කරන ලද අයිතියක් ලබා දී ඇති සහ විලම්භිත බදු සහ ආදායම් බදු එකම බදු ආයතනයකට අදාළ වන්නේ නම් පමණි.

විලම්භිත බදු වත්කමෙහි ධාරණ අගය සෑම ගිණුම්කරණ වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරන අතර, හිලව් කිරීමට තරම් ප්‍රමාණවත් අනාගත බදු බැදියාවක් නොමැති යැයි තහවුරු වන විට එහි අගය එයට සමානුපාතිකව අඩු කරනු ලැබේ. හඳුනානොගත් විලම්භිත බදු නැවත මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනට තක්සේරු කරන අතර, එම බදු පියවීම සඳහා ප්‍රමාණවත් අනාගත බදු වන ලාභයක් ඉපැයීමට ඇති හැකියාව මත ගිණුම් වාර්තා තුළ හඳුනා ගනු ලැබේ.

ප්‍රයෝජනයට නොගත් බදු හානි, බදුබැර, අඩු කළ හැකි තාවකාලික විචලනයන් යන අයිතම සඳහා, ඒවා පියවීමට තරම් අනාගත බදු වන ලාභයක් ඉපයීමේ ඇති හැකියාව මත විලම්භිත බදු හඳුනා ගනු ලැබේ.

**3.16** සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

සමාගම 'විශ්‍රාම ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලැස්ම' හා 'නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම' භාවිත කරයි.

**3.16.1** විශ්‍රාම ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලැස්ම

ආයතනය විසින් වෙනම අරමුදලකට නිශ්චිත දායකත්වයක් ලබාදීම මගින් මෙම විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය පවත්නාගෙන යනු ලැබේ. මෙම නිශ්චිත අගය හැර වෙනයම් හෝ දායකත්වයක් සඳහා ආයතනය සතුව නෛතික හෝ ස්වනිර්මාණිත වගකීමක් නොමැත. මෙම දායකත්වය සේවකයා විසින් සේවය සපයන කාලසීමාව තුල සේවක වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

**3.16.2** සේවක අර්ථසාධක අරමුදල

සමාගම සහ සේවකයින් සෑම සේවකයකුගේ වැටුපෙන් 12% සහ 10% ලෙස පිලිවෙලින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරන සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

**3.16.3.** සේවක භාරකාර අරමුදල

සමාගම සෑම සේවකයකුගේ වැටුපෙන් 3% ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරන සේවක අර්ථසාධක අරමුදලට දායක වේ. නිර්වචිත දායක සැලසුමට දායක වීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වියදම දැරූවිට හඳුනා ගනී.

**3.16.4** නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැස්ම සේවකයන් විශ්‍රාම යැමේදී ඔවුනට ප්‍රතිලාභ සැලසීමේ සැලැස්මක් වේ. මෙය නිශ්චිත දායකත්ව සැලැස්මෙන් වෙනස් වේ. වර්ෂ 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව සමාගම විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා බැඳී ඇත. මූල්‍ය ප්‍රකාශණ වල හඳුනාගෙන ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ක්‍රමය හා සබැඳි වගකීම මූල්‍ය ප්‍රකාශණ දිනට ඇති නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයයි. නිශ්චිත ප්‍රතිලාභ වගකීම අදාළ සූත්‍රය භාවිතකොට ගණනය කර ඇත. පෙර වර්ෂයේ දී මේ සඳහා පළපුරුදු ලත් ආයුගණක ආයතනයක් සම්බන්ධ කර ගත් අතර LKAS 19 හි උපග්‍රන්ථ D හි 57 වෙනි වගන්තිය ප්‍රකාරව සමාගමේ පාරිතෝෂික වෙන් කිරීම මෙම වසර සඳහා සිදු කරන ලදී.

පාරිතෝෂික ගණනයේ දී ඇති වන ලාභ හා අලාභ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති අතර, අනුසාංගික සේවක පිරිවැය සහ අනෙකුත් පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත. සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් ආයතනයේ ඇති වන වගකීම බාහිර පාර්ශව මඟින් අරමුදල් ලබා ගැනීමකින් තොරව සිදු කරයි.

**3.16.5.** කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

**3.17** වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

අතීතයේ සිදුවූ සිදුවීමක් හේතුවෙන් වර්තමානයේ නෛතික හෝ ස්වයං නිර්චිත වගකීමකට බැඳීමට සමාගමට සිදුවේ නම් හා එම වගකීම පියවීම සඳහා සමාගමේ ආර්ථික සම්පත් වැය කිරීමට සිදුවීමේ සම්භාවිතාවයක් ඇත්නම් සමාගම මෙහෙයුම් වියදම් සඳහා වූ වෙන්කිරීම් හඳුනා ගනී.

වෙන්කිරීම් මණිනුයේ වර්තමාන බැදියාව පියවීමට අවශ්‍ය ඇස්තමේන්තු වියදමට අනුවය. මෙම වියදම ඇස්තමේන්තුගත කරණුයේ වාර්තාකරණ දිනට ඇති විශ්වාසදායි සාක්ෂි පදනම් කරගෙනය. මෙහිදී වර්තමාන බැදියාව (වගකීම) හා ආශ්‍රිත අවදානම සහ අනපේක්ෂිත තත්වද සලකා බලනු ලබයි.

**3.18** ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන්

අනාගතයේ සිදුවිය හැකි අවිනිශ්චිත සිදුවීමක් හෝ වර්තමාන බැදීමක් සිදුවීම හේතුවෙන් ආයතනයේ ආර්ථික සම්පත් ආයතනයෙන් පිටතට ගලා යාමේ සම්භාවිතාවක් ඇත්නම් අසම්භාව්‍ය වගකීම් හඳුනා ගැනේ. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන් වල හෙළි දරව් කෙරේ.

**3.19** වාර්තාකරණ කාලපරිච්චේදයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ජේදයට පසු සිදුවීම් වල ප්‍රමාණවත් භාවය සලකා බලා අවශ්‍ය පරිදි සුදුසු ගැලපිලි සහ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශවල සිදු කෙරේ.

සම්පත් පිටතට ගලා යෑමේ ප්‍රවනතාව දුරස්තර නම් හැර සියලුම අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන් වල හෙළිදරව් කෙරේ.

**3.20** මූල්‍ය වගකීම් - අසම්භාව්‍ය බැරකම් හෙළදරව් කිරීම.

මෙහෙයුම් වියදම් සඳහා වෙන් කිරීම් හඳුනාගනු ලබනුයේ, අතීත සිදුවීමක් මත වර්තමානයේ හටගත් නෛතික හෝ නිර්මිත බැඳියාවක් පවතීනම් සහ ආයතනයේ ආර්ථික සම්පත් බැහැරව ගලාගෙන යෑමේ හැකියාවක් පවතීනම් සහ එම සම්පත් ගලා යාම විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් පමණි.

වෙන්කිරීම් ගිණුම් කරනුයේ වාර්තා දින වන විට පැවති වඩා විශ්වාසදායි සාක්ෂි මත පදනම් කර ගත් වර්තමාන බැඳියාව ඇවර කිරීම සඳහා ඇස්තමේන්තු ගත වියදමට අනුකූලවය. තවද මෙහිදී වර්තමාන බැඳියාව හා සම්බන්ධිත අවධානම් සහ අවිනිශ්චිතාතවන් ද අවධානයට ගනී.

ආයතනයෙන් ආර්ථික සම්පත් බැහැරව ගලා යාමක් පිළිබඳ හැකියාව අවම වූ අවස්ථාවක හැර, අන් අවස්ථාවන් වලදී අසම්භාව්‍ය බැරකම් සටහනක් ලෙස හෙළදරව් කරනු ලබයි.

- පසුගිය වර්ෂය තුළ මෙ.ටො. 41.891ක සහ රු.මි. 1.2ක වටිනාකමකින් යුත් පොහොර තොගයක ඌනතාවක් නිරීක්ෂණය වුණි. මෙම ඌනතාවය පිළිබඳ සභාපතිතුමාගේ මගපෙන්වීම යටතේ අප සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණයක් සිදු කරගෙන යන අතර, මේ දක්වා හානිය පිළිබඳ අවසන් නිගමනයකට එළඹ නොමැති හෙයින් ගිණුම් පොත් වල මේ සඳහා වෙන් කිරීමක් සිදු කර නොමැත.

## 4. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ට අනුව සෘජු ක්‍රමයට සකස් කරනු ලැබේ. පූර්ව දැනුවත් වටිනාකමකට හුවමාරු කිරීමට සූදානමින් පවතින හා එම වටිනාකමෙහි වෙනසක් සිදුවීමේ අවධානම ඉතා අඩු අගයක පවතින, ඉහල ද්‍රවශීලතාවයක් සහිත කෙටි කාලීන ආයෝජන වලින් මුදල් සහ මුදල් වලට සමාන දෑ සමන්විත වේ. මුදල් සහ මුදල් වලට සමාන දෑ වලට අතැති ද මුදල්, බැංකු ශේෂ, බැංකු තැන්පතු, ඒක්ෂණ මුදල් ඇතුලත් වේ.

## 5. ආදායම් හඳුනාගැනීම

භාණ්ඩ විකිණීම හේතු කොටගෙන ලද හා ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙහි ශුද්ධ (ජාතිය ගොඩනැගීමේ බදු අඩු කොට) සහනාධාර වටිනාකමෙන් ආදායම් මණිනු ලැබේ. සමාගම විසින් ආදායම් හඳුනාගනු ලබන්නේ අදාල ආදායමෙහි වටිනාකම විශ්වාසදායි ලෙස මිණිය හැකි වන විට සහ අනාගත ආර්ථික වාසි ආයතනය වෙත ගලා ඒමේ ඉහල සම්භාවිතාවක් ඇති විටය.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

### 5.1 පොහොර විකිණීම

සමාගම සෘජු පොහොර ආනයන කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම සිදු කරයි. භාණ්ඩ සම්බන්ධ සියළුම අවධානම් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයාට මාරුවන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් නිකුත් කරනු ලබන අවස්ථාවේදීම ආදායම හඳුනා ගනී.

### 5.2. පොළී ආදායම

සඵල පොළි අනුපාතිකය භාවිත කර පොළී ආදායම හඳුනාගනී.

### 5.3. කුලි ආදායම

කුලි ආදායම හඳුනාගනු ලබන්නේ බදු කාලය තුල උපචිත පදනම මතය.

### 5.4. දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගයන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සංසන්දනය කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනාගනී.

### 5.5. වෙනත් ආදායම්

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මතය.

## 6. වියදම්

ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සඳහා සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා කරන ලබන සියලුම වියදම් වර්ෂයේ ලාභ ගණනය කිරීමේ දි ආදායමට අය කෙරේ. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණ ක්‍රමය සමාගමේ මූලික කාර්ය සාධකය සාධාරණ ලෙස ඉදිරිපත් කරණ බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වන නිසා එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමය තෝරා ගෙන ඇත. ස්ථාවර ස්වරූපයෙන් පවතින එමගින් ව්‍යාපාර කරගෙන යන වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරිම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදු කෙරෙන හෝ ව්‍යාපාරයේ ඉපැයීමේ ධාරිතාව වැඩිකිරිම කෙරෙන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.

අළුත්වැඩියා සහ අළුත්කිරීම් වියදම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයයේ ආදායමට අය කරනු ලැබේ. සමාගම ඉපැයු ලාභ යනු ආදායම් බදු වියදමට පෙර සහ සියලුම දන්නා වගකීම් සහ හානිකරණ සහ දේපල, පිරියත සහ උපකරණ වල ක්ෂය සඳහා ප්‍රතිපාදනය කළ පසුවේ.

## 7. ලාභාංශ මත රඳවා ගැනීමේ බදු

බදු ගෙවිය යුතු ලාභයෙන් බෙදා හැරෙන ලාභාංශ 10% බදු වලට යටත්වේ.

## 8. කොටසක මූලික ඉපයුම

සාමාන්‍ය කොටස් හිමියන් සඳහා කොටසක මූලික ඉපයුම මූල්‍ය ප්‍රකාශණයෙන් ඉදිරිපත් කරයි. කාලච්ඡේදය තුල නොගෙවු සාමාන්‍ය කොටස් ගණන සාමාන්‍ය කොටස් හිමියන් වෙත බෙදාහැරිය හැකි ලාභය හෝ අලාභයෙන් බෙදීමෙන් කොටසක මූලික ඉපයුම ගණනය කරනු ලබයි.

## 9. ආශ්‍රිත පාර්ශවකරුවන් සමග ගනුදෙනු

එක් පක්ෂයක් අනෙක් මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති/තීරණ සැළකිය යුතු බලපෑමක් පාලනය හෝ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව ඇති වන ගනුදෙනු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති බව හෙළිදරව් කරයි.

## 10. තවම බලාත්මක නොවූ නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිතී

සමාගමේ මූල්‍ය ප්‍රකාශයේ නිකුත් කළ දිනවන විට නිකුත් කර ඇති තවම බලනොපත්වන ප්‍රමිතී පහත දැක්වේ. සමාගම එම ගිණුම්කරණ ප්‍රමිතී බලාත්මකවූ පසු භාවිතයට යොදා ගනී.

### 10.1 ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන ප්‍රමිත අංක 13-සාධාරණ අගයට මිණුම් කිරීම.

මෙම ප්‍රමිතිය යටතේ සාධාරණ අගය මිනුම් කිරීම එක් රාමුවකට අන්තර්ගත කර ඇත. ප්‍රමිත අංක 13 යටතේ සාධාරණ අගයට මිනුම් කිරීම පිළිබඳ හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. වර්ෂ 2014 අප්‍රේල් 01 දා සිට එම ප්‍රමිත අංකය අප සමාගම බලාත්මක කොට ඇත. ගිණුම් වර්ෂයේ සිට ඉදිරියට වන ගනුදෙනු සඳහා මෙම ප්‍රමිත අංකය අදාළ කොට ගෙන ඇති අතර, සමාලෝචිත පූර්ව වර්ෂ වල සංසන්දනාත්මක දත්තයන් මෙම ප්‍රමිත අංකය යටතේ යලි වෙනස් කිරීමට අතවශ්‍ය නොවේ.

### 10.2 ශ්‍රී ලංකා මූල්ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 - මූල්‍ය උපරකණ

මෙම ප්‍රමිතයෙහි අරමුණ නම් මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණය පිළිබඳ මූලධර්මයක් පිහිටුවීම සහ මූල්‍ය ප්‍රකාශණ භාවිත කර තම ආයතනයෙහි අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතභාවය පිළිබඳ තක්සේරු කරන්නන්ට ප්‍රයෝජනවත් තොරතුරු ලබා දීමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි විෂය පථයට අයත් සියළුම මූල්‍ය උපකරණ සඳහා ඉහත ප්‍රමිත අංක 09 යෙදිය යුතු වේ. මෙම ප්‍රමිතයෙහි බලාත්මක දිනය මතුවට කල් දමා ඇත.

මීට අමතරව පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිතයන් ද වෙනස් කර ඇතත් මේවාහි යෙදවුම සමාගමේ මූල්‍ය ප්‍රකාශණ කෙරෙහි කිසිඳු බලපෑමක් එල්ල කරනු නොලබයි.

### 10.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 - ගිණුම්කරණ මූලධර්ම වල සැලකිය යුතු වෙනස්කම්

***I. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.16***

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.16 කල්බදුවක නීත්‍යානුකූල ස්වරූපයට සම්බන්ධ ගනුදෙනුවල වඩා වැදගත් අංගයන් තක්සේරු කරමින් ලං.ගි.ප්‍ර. 17 අභිබවායනු ලබයි. ප්‍රමිතමගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම ඉදිරිපත්කර ඇති අතර බොහෝ කල්බදූ ශේෂ පත්‍රයේ හඳුනා ගන්නාලෙස බදු කරුවන්ට නියම කරනු ලබයි.

සමාගම 2019/2020 මූල්‍ය වර්ෂය තුළ මූල්‍ය කල්බදු පදනම මත වාහන තුනක් මිලදී ගෙන ඇත. පූර්ව කාල පරිච්ඡේදයන් සඳහා කල්බදු ගනුදෙනු නොතිබූ බැවින්, එය වාර්තා කිරීමට කිසිදු ගැලපීමක් සිදුකිරීමට අවශ්‍ය නොවේ.

ආරම්භක දිනයේදී මාස 12 ක් හෝ ඊට අඩු කල්බදු කාල සීමාවක් ඇති සහ මිලදී ගැනීමේ විකල්පයක් අන්තර්ගත නොවන (කෙටිකාලීන කල්බදු) සහ අදාළ වත්කම සඳහා අඩු වටිනාකමක් ඇති (අඩු වටිනාකම් වත්කම්) කල්බදු ගිවිසුම් පිළිගැනීමෙන් නිදහස්වීමේ ක්‍රමවේදය භාවිතා කිරීමට සමාගම තෝරාගෙන ඇත. සමාගම විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.16 අනුගමනය කිරීමෙන් පසු පසු, කෙටිකාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම්වල කල්බදු හැර, සියළුම කල්බදු සඳහා තනි පිළිගැනීමක් සහ මිනුම් ක්‍රමයක් අදාළකරගන්නා කරන ලදි. සමාගම විසින් කල්බදු ගෙවීම් සිදුකිරීම සඳහා කල්බදු වගකීම් හඳුනාගෙන තිබෙන අතර අදාළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරමින් වත්කම් භාවිතා කිරීමේ අයිතිය පිළිබඳ හඳුනාගෙන ඇත. 2019 අප්‍රේල් 01 දිනෙන් පසු අදාළ වන ප්‍රතිපත්තිය වන්නේ කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී සමාගම විසින් කල්බදුවක් පවතීද හෝ අන්තර්ගතවේද යන්න පිළිබඳ තක්සේරු කිරීමයි. මුදල් ගෙවීමක් සඳහා හුවමාරුවක් වශයෙන් හඳුනාගත් වත්කමක් යම් කාලයක් සඳහා භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ගිවිසුමක් මගින් ලබා දෙන්නේ නම්, ගිවිසුමක් යනු කල්බද්ක් හෝ කල්බද්ක් අන්තර්ගත වීමකි. සමාගම විසින් කල්බදු ආරම්භක දිනයේදී අදාළ වත්කම භාවිතා කිරීමට ඇති අයිතිය නියෝජනය කරන වත්කම භාවිතා කිරීමේ අයිතිය සහ කල්බදු වගකීම හඳුනා ගනී.

<u>වත්කම භාවිතා කිරීමේ අයිතිය</u>

වත්කමක භාවිතයේ අයිතිය මූලිකව පිරිවැයට මනිනු ලැබේ. කල්බදු වගකීමක ආරම්භක මුදල, ආරම්භක දිනයේදී හෝ ඊට පෙර සිදු කරන ලද කල්බදු ගෙවීම් සඳහා කරන ලද ගැලපීම් සහ දරනලද ආරම්භක සෘජු පිරිවැය, සහ ලැබූ කිසියම් දිරිදීමනා වෙතොත් එය අඩුකරනලද, අදාළ වත්කම ගැලවීමටහෝ ඉවත් කිරීමට හෝ අදාළ වත්කම හෝ වැඩබිම එය පිහිටා ඇති ස්ථානය යථා තත්වයට පත් කිරීම සඳහා වන පිරිවැය ඇස්තමේන්තු කිරීම මෙයට ඇතුළත් වේ. ආරම්භක දිනයට පසුව, සමාගම විසින් පිරිවැය ආකෘතිය මත වත්කම භාවිතා කිරීමේ අයිතිය පිළිබඳ මනිනු ලැබේ. අදාළ වත්කම්වල කල්බදු කාල සීමාව හා වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය යන කාලසීමාවලින් වඩා අඩු කාලසීමාව පුරා සරල මාර්ග ක්‍රමවේදය භාවිතා කරමින් භාවිතයට අයිතිය ඇති වත්කම් ක්ෂය කරනු ලැබේ. කල්බදු කාලපරිච්ඡේදය අවසානයේදී කල්බදු වත්කම්වල හිමිකාරිත්වය

**සමාගමට පවරනුලබයිනම් හෝ භාවිතයට අයිතිය ඇති වත්කමෙහි පිරිවැය මගින් මිලදී ගැනීමේ විකල්පයක් පිළිබිඹු කරයි නම්, අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය පුරා වත්කම ක්ෂයකරනු ලැබේ. වත්කම් භාවිතයේ අයිතිය හාණිකරණයට යටත් වේ.**

<u>කල්බදු වගකීම</u>

**කල්බදු වගකීම මූලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද, කල්බදු සඳහා ගම්‍ය වන පොලී අනුපාතය භාවිතා කර වට්ටම් කරන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මනිනු ලැබේ. එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, ආරම්භක භාවිතයේදී සමාගම කල්බදු වගකීම තීරණය කිරීම සඳහා වට්ටම් අනුපාතය ලෙස වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරනු ලබයි. කල්බදු ගිවිසුමේ සඳහන් පොලී අනුපාතය භාවිතා කරමින් සමාගම සිය වර්ධක ණය ගැනීමේ අනුපාතය තීරණය කරයි. කල්බදු වගකීම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ. ආරම්භක දිනයට පසු, කල්බදු වගකීම සඳහා පොළිය පිළිබිඹු කිරීම සඳහා ධාරණ අගය වැඩි කිරීම, බදු ගෙවීම් පිළිබිඹු කිරීම සඳහා ධාරණ අගය අඩු කිරීම සහ කිසියම් වෙනස් කිරීමක් පිළිබිඹු වන පරිදි ධාරණ අගය නැවත ගණනය කිරීම, අදාළ වත්කම මිලදී ගැනීම සඳහා බදු කාල සීමාව, කල්බදු ගෙවීම්, විකල්පයක තක්සේරුකිරීම් වෙනස් කිරීම මගින් සමාගම කල්බදු වගකීම මනිනු ලබයි.**

<u>කෙටිකාලීන කල්බදු සහ අඩු වටිනාකමකින් යුත් වත්කම් කල්බදු ගැනීම්</u>

**අඩු වටිනාකමකින් යුත් වත්කම් සහ කෙටිකාලීන කල්බදු සඳහා වත්කම් භාවිතා කිරීමේ අයිතිය සහ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට සමාගම තීරණය කර ඇත. මෙම කල්බදු හා සම්බන්ධ කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව පුරා සරල මාර්ග පදනමක් මත හෝ කල්බදුවලින්වලින් ලැබෙන ප්‍රතිලාභවල කාල රටාව නියෝජනය කරනු ලබන වෙනත් ඕනෑම පදනමක් මත සමාගම විසින් හඳුනාගනු ලබයි.**

<u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරිපත් කරීම</u>

**සමාගම විසින් භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් වෙනත් වත්කම්වලින් සහ කල්බදු වගකීම් වෙනත් වගකීම්වලින් වෙන් වෙන් වශයෙන් සිය 'මූල්‍ය තත්ත්වය' ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබයි. 2019 අප්‍රේල් 01 දිනට පෙර අදාළ ප්‍රතිපත්තිය - ලං.ගි.ප්‍ර. 17 - "කල්බදු" යටතේවන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ IFRIC 4 - "ගිවිසුමක කල්බදුවක් අන්තර්ගතවේද යන්න තීරණය කිරීම"**

<u>මූල්‍ය කල්බදු</u>

**සමාගම විසින් සියළුම අවදානම් සහ හිමිකාරිත්වයේ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස උපකල්පනය කරන කල්බදු මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කර ඇත. මූලික හඳුනාගැනීමේදී, දේපල, පිරියත සහ උපකරණ යටතේ කල්බදු වත්කම් එහි සාධාරණ වටිනාකමට සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට යන වටිනාකම්වලින් අඩු අගයට සමාන මුදලකට මනිනුලැබේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, එම වත්කමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වත්කම ගණනය කරන ලදී. මූල්‍ය කල්බදු යටතේ අවම කල්බදු ගෙවීම් මූල්‍ය වියදම සහ හිඟ වගකීම් අඩු කිරීම අතර බෙදා ඇත. වගකීම්වල ඉතිරි ශේෂය මත නිරන්තර කාලීන පොලී අනුපාතයක් ඇති කිරීම සඳහා කල්බදු කාල සීමාව තුළ එක් එක් කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය වියදම වෙන් කරන ලදී.**

**11** කල්බදු ඉඩම්

**CP/18/1740/820, කැබිනට් පත්‍රය සඳහා ලද 2018.09.05 දින ලද තීරණය ප්‍රකාර, අප සමාගම විසින් හම්බන්තොට මයුරපුර වලව විශේෂ බල ප්‍රදේශයේ මහවැලි අධිකාරිය යටතේ වූ හෙක්ටයාර 0.0894 භූමි ප්‍රමාණයකින් යුත් වූ ඉඩමක් අවුරුදු 30 කාල සීමාවක් සඳහා බදු පදනම මත අත් කර ගන්නා ලදී. මෙම ඉඩමෙහි තක්සේරු වටිනාකම රු. 11,515,000/-කි. වාර්ෂික බදු කුලිය රු.230,300.00කි.**

**9.4** **සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

**2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| ආදායම | 12 | 260,549,059 | 207,177,447 |
| විකුණුම් පිරිවැය | 13 | (142,450,630) | (29,395,165) |
| දළ ලාභය (අලාභය) | | 118,098,430 | 177,782,282 |
| වෙනත් ආදායම් | 14 | 4,290,203 | 83,011,716 |
| | | 122,388,633 | 260,793,998 |
| පරිපාලන වියදම් | 15 | (126,520,558) | (128,074,102) |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 16 | (2,393,019) | (751,203) |
| වෙනත් වියදම් | 17 | (353,449) | (692,404) |
| මෙහෙයුම් ලාභය (අලාභය) | | **(6,878,393)** | **131,276,289** |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | 18 | 561,736,554 | 369,867,507 |
| මූල්‍ය ආදායම | 18.a | (566,202,609) | (397,375,941) |
| මූල්‍ය වියදම | 18.b | 4,466,055 | 27,508,434 |
| බදු පෙර ලාභය (අලාභය) | | **554,858,161** | **501,143,796** |
| ආදායම් බදු වියදම් | 19 | (262,104,581) | (139,948,197) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | **292,753,580** | **361,195,599** |
| **වෙනත් විස්තීරණ ආදායම් (වියදම්)** | | | |
| *ලාභ හෝ අලාභ සඳහා වර්ගීකරණය නොකරන අයිතම* | | | |
| ආයු ගණනය මත ලාභය /අලාභය | | (8,884,019) | 7,959,181 |
| දේපළ, පිරියත සහ උපකරණ නැවත ඇගයීමෙන් ඇතිවන බලපෑම | | 412,151,319 | - |
| මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම | | **403,267,300** | **7,959,181** |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | **696,020,880** | **369,154,780** |
| කොටසක මූලික ඉපයුම | 20 | 29.28 | 36.12 |

වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි

## 9.5 සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

**2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන**

**2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකශය**

| | සටහන | 2023/2024 | 2022/2023 |
|---|---|---|---|
| | | **Rs.** | **Rs.** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 21 | 903,691,846 | 525,838,827 |
| **වත්කම් භාවිතා කිරීමේ අයිතිය** | 22 | 12,756,329 | 16,842,313 |
| අස්පෘෂ්‍ය වත්කම් | 23 | 916,667 | 1,833,333 |
| ප්‍රාග්ධන නොනිම් වැඩ | 24 | 4,837,791 | 4,837,791 |
| | | **922,202,632** | **549,352,264** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය සහ අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය | 25 | 1,439,743,632 | 54,581,256 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 26 | 11,408,751,873 | 17,935,343,439 |
| සේවක ණය හා අත්තිකාරම් | 27 | 16,887,866 | 17,056,510 |
| තැන්පතු හා අත්තිකාරම් | 28 | 9,769,326 | 4,968,626 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 29 | 3,637,072,070 | 2,520,635,971 |
| බැංකු හා අතැති මුදල් | 30 | 7,126,452 | 42,983,959 |
| **මුළු ජංගම වත්කම්** | | **16,519,351,218** | **20,575,569,760** |
| | | | |
| **මුළු වත්කම්** | | **17,441,553,850** | **21,124,922,024** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31 | 100,000,000 | 100,000,000 |
| ප්‍රාග්ධන සංචිත | 32 | 1,683,685 | 1,683,685 |
| පිළිසකරණ හා ප්‍රත්‍යාගණන සංචිත | 33 | 1,124,873,150 | 712,721,831 |
| රඳවා ගත් ලාභ | | 3,060,888,060 | 2,617,873,151 |
| | | **4,287,444,894** | **3,432,278,667** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක පාරිතෝෂික බැදීම | 34 | 24,130,029 | 17,046,187 |
| විලම්භිත බදු | 35 | 219,554,155 | 134,666,957 |
| පොළී සහිත ණය | 36 | - | 5,555,353,975 |
| **දිගු කාලීන කල්බදු වගකීම්** | 37 | - | 1,351,816 |
| | | **243,684,184** | **5,708,418,936** |
| **ජංගම වගකීම්** | | | |
| පොලී සහිත ණය ගැනීම් | 36 | 4,126,480,636 | 8,622,758,030 |
| **කෙටිකාලීන කල්බදු වගකීම්** | 37 | 866,861 | 3,423,985 |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 38 | 2,475,672,431 | 2,836,730,396 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 39 | 65,758,051 | 185,112,237 |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | 40 | 62,843,803 | 170,422,583 |
| උපචිත වියදම් | 41 | 13,442,207 | 100,929,457 |
| බැංක අයිරා | 30 | 137,747,620 | 64,847,733 |
| **මුළු ජංගම වගකීම්** | | **6,882,811,609** | **11,984,224,421** |
| | | | |
| **මුළු හිමිකම හා වගකීම** | | **11,413,940,688** | **21,124,922,024** |

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශතා වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇති බැව් සහතික කරමි .

……………………………..

**මුදල් කළමණාකරු**

**එස්.එන්.ජේ. වික්‍රමසිංහ**

මෙම මූල්‍ය ප්‍රකාශ පලකර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි . මෙම ගිණුම් වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරන ලදී.

………………………………… …………………………………

ආචාර්ය ජගත් පෙරේරා — කේ.ඒ.ඩබ්ලිව් ප්‍රනාන්දු

*සභාපති* — අධ්‍යක්ෂක

9.6

**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

**2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන**

**ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීමේ ප්‍රකාශය**

| | කොටස් ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| **31-03-2022 දිනට ශේෂය** | **100,000,000** | **1,683,685** | **712,721,831** | **2,261,344,137** | **3,075,677,332** |
| **කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/(අලාභය)** | - | - | - | 369,154,780 | 369,154,780 |
| **ලාභාංශ** | - | - | - | (10,000,000) | (10,000,000) |
| **පූර්ව වර්ෂ ගැලපුම්** | - | - | - | (2,625,766) | (2,625,766) |
| **31-03-2023 දිනට ශේෂය** | **100,000,000** | **1,683,685** | **712,721,831** | **2,617,873,151** | **3,432,206,346** |
| **වසර සඳහා විස්තීර්ණ ආදායම** | | | | | |
| **කාලච්ඡේදයේ ශුද්ධ ලාභය/(අලාභය)** | - | - | - | 292,753,580 | 292,753,580 |
| **දේපළ, පිරියත සහ උපකරණ නැවත ඇගයීමෙන් ඇතිවන බලපෑම** | - | - | 412,151,319 | - | 412,151,319 |
| **වසර සඳහා අනෙකුත් විස්තීර්ණ වියදම් (බදු රහිත)** | - | - | - | (8,884,019) | (8,884,019) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **-** | **-** | **412,151,319** | **283,869,561** | **696,020,880** |
| **ලාභාංශ** | - | - | - | (60,000,000) | (60,000,000) |
| **පූර්ව වර්ෂ ගැලපුම්** | - | - | - | 219,145,347 | 219,145,347 |
| **31-03-2024 දිනට ශේෂය** | **100,000,000** | **1,683,685** | **1,124,873,150** | **3,060,888,060** | **4,287,372,573** |

**වරහන් තුල ඇති අගයන් වලින් අඩු කිරීම් පෙන්වයි**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
**2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන**
*(සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි.)*

| මාර්තු 31න් අවසන් වරස සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | 2024 | 2023 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලා ඒම | | | |
